වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT

2023



ජාතික ගමනාගමන කොමිෂන් සභාව
தேசிய போக்குவரத்து ஆணைக்குழு
NATIONAL TRANSPORT COMMISSION

ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජාගකොස)

ලිපිනය

241,

උද්‍යාන පාර,

කොළඹ 05.

වෙබ් අඩවිය

www.ntc.gov.lk

විද්‍යුත් තැපෑල

info@ntc.gov.lk

ක්ෂණික ඇමතුම්

1955



අපගේ දැක්ම...

දිවයින තුළ සමාජ-ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ගුණාත්මක, පිරිවැය ඵලදායී සහ ආරක්ෂාකාරී ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් හා සේවාවක් මගින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම විවිධ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහතිකවීම.



අපගේ මෙහෙවර...

මගී ප්‍රවාහනයට අදාල ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම සහ පොදුජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස් කිරීම.



අපගේ ඉලක්කය.....

සුරක්ෂිත, සුවපහසුව, විශ්වසනීය සහ සමාන අවස්ථා සහිතව සැමට පොදු ප්‍රවාහන සේවයට ප්‍රවේශ වීමට ඉඩ ප්‍රශස්ථ මට්ටමින් සැලසීම

අපගේ අරමුණු



විශ්වසනීය හා මිත්‍රශීලී පොදු මගී ප්‍රවාහන සේවාවක් දිවයින තුළ ස්ථාපිත කිරීම.

සමාජයීය වශයෙන් අවශ්‍ය වන එහෙත් ලාභ නොලබන මාර්ගවල බස්රථ මගින් මගී ප්‍රවාහනයට අදාල ප්‍රමාණවත් සේවාවන් මෙහෙයවීම සඳහා විධිවිධාන සැලැස්වීම.

නවීන තාක්ෂණය පදනම් කරගනිමින් සුහුරු ප්‍රවාහන සේවාවක් හදුන්වා දීම.

මගී ප්‍රවාහනයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය පහසුකම් පොදු මගී ප්‍රවාහන සේවාව තුළ ස්ථාපිත කිරීම.

විශ්වසනීය හා මිත්‍රශීලී මගී ප්‍රවාහන සේවා මෙන්ම භාණ්ඩ ප්‍රවාහන සේවා පහසුකම් ද පොදු මගී ප්‍රවාහන මාධ්‍ය තුළ සැපයීම.

සෑම පුද්ගලයෙකුටම දැරිය හැකි ගාස්තු ක්‍රමයක් පොදු මගී ප්‍රවාහන සේවා සඳහා හදුන්වා දීම.

පොදු මගී ප්‍රවාහන බස්රථ මගින් සිදුවන මාර්ග අනතුරු අවම කිරීම.

වාහන මඟින් සිදු වන පරිසර දූෂණය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

මගී ප්‍රවාහන සේවාව හා සම්බන්ධ මානව සම්පත් සංවර්ධනය.

අපගේ වටිනාකම්




Team Work
We collaborate to deliver results

(සාමූහිකත්වය /කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම - ප්‍රතිඵල ලබා දීමට අපි සහයෝගයෙන් කටයුතු කරන්නෙමු)



Resilience
We are ready to recover from the troublous situations quickly

(සුනම්‍යබව /ප්‍රත්‍යාස්ථිතිය) - ගැටළුකාරී තත්ත්වයන් ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමට අපි සූදානම්ව සිටිමු)



Integrity
We maintain the utmost level of honesty & integrity

(පරිපූර්ණබව/අඛණ්ඩතාව - අපි උපරිම මට්ටමේ අවංකභාවය සහ සත්‍යාගරුකභාවය අඛණ්ඩව පවත්වා ගනිමු)



Caring
We display kindness and concern for stakeholders

(රැකවරණය - අපි පාර්ශවකරුවන් කෙරෙහි කරුණාව සහ රැකවරණය ප්‍රදර්ශනය කරමු)



Excellence
We provide excellence performance in our deliverables

(විශිෂ්ටත්වය - අපි අපගේ සේවාවන් වලදී විශිෂ්ට කාර්ය සාධනයක් ලබා දෙන්නෙමු)



Progressive
We uphold innovative & conductive progress

(ප්‍රගතිශීලීබව - අපි නව්‍ය සහ ගතිකත්වයේ ප්‍රගතිය තහවුරු කරමු)



Safety
We ensure safe secure & heathy environment

(ආරක්ෂාව - අපි ආරක්ෂාකාරී සහ යහපත් පරිසරයක් සහතික කරමු)

පටුන

	පරිච්ඡේදය	පිටුව
❖	ආයතනය පිළිබඳ හැඳින්වීම	10
❖	කොමිෂන් සභාවේ කර්තව්‍ය	11
❖	කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය	13
❖	සභාපතිතුමාගේ පණිවිඩය	17
❖	විගණන හා කළමනාකරණ කමිටු සාමාජික මණ්ඩලය	19
❖	කොමිෂන් සභාවේ සංයුතිය	20
❖	2023 වර්ෂයේ කාර්යසාධන	22
01.	ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව	23
02.	සැලසුම් දෙපාර්තමේන්තුව	35
03.	තත්ත්වාරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව	59
04.	පරිපාලන දෙපාර්තමේන්තුව	68
05.	වාර්ෂික ගිණුම්	72
06.	විගණකාධිපති වාර්තාව	89

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ආයතනය පිළිබඳ හැඳින්වීම.

බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපනය කර ඇත.
නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද එනම් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන,ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකුගෙන්; ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිළධරයෙකුගෙන්; මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, අධ්‍යක්ෂවරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිළධරයෙකුගෙන් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ගරු ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන්ද කොමිෂන් සභාව සමන්විත වේ.

උක්ත පනතින් පැවරී ඇති කර්තව්‍යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම්, ධාවන හා සේවා අධීක්ෂණ, තත්ත්ව ආරක්ෂණ සහ බාහිර සම්බන්ධතා, මුදල් හා ප්‍රසම්පාදන යන දෙපාර්තමේන්තු හතරක් සහ පාලන, අභ්‍යන්තර විගණක හා නීති යන අංශ තුනක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අතර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය අංක 241,උද්‍යාන පාර, කොළඹ 05 යන ලිපිනයේ පිහිටා ඇත. කොළඹ බැස්ටියන් මාවත අන්තර්පළාත් පෞද්ගලික බස්නැවතුම් අංගනය සහ වවුනියාව ප්‍රධාන බස් නැවතුම් අංගනය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ශාඛා කාර්යාල වශයෙන් ක්‍රියාත්මක වේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 224 වන අතර සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන දෙපාර්තමේන්තු හතරක් යටතේ කටයුතු කරන අධ්‍යක්ෂ වරුන් හතර දෙනෙකුගෙන් කොමිෂන් සභාවේ ජේෂ්ඨ කළමණාකාරිත්වය සමන්විතවේ.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 8වන හා 9වන වගන්ති වල ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කර්තව්‍ය හා බලතල පහත පරිදි වේ

කොමිෂන් සභාවේ කර්තව්‍ය

කොමිෂන් සභාවේ කර්තව්‍ය, බස්රථ මඟින් මගී ප්‍රවාහන සේවාවන්ට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය කෙරෙහි සැළකිල්ල ඇති ව -

(අ) මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස පිළිගත හැකි තත්ත්වයකින් යුත් බස්රථ සේවා පවතින්නේද යන වග අවලෝකනය කිරීම සහ එම සේවා පවත්වාගෙන යායුතු අවම මට්ටම තීරණය කිරීම;

(ආ) වෙන් වෙන් ගාස්තු මත මඟින් ගෙනයාම සඳහා බස් රථයක් යොදා ගැනීමට බලය දෙන බස්රථ ධාවන අවසර පත්‍රයක් හෝ වෙනත් අධිකාරයක් බලය ලත් තැනැත්තකු විසින් නිකුත් කිරීම හෝ අළුත් කිරීම කළ හැකි වන්නේ යම් කොන්දේසි වලට යටත්වද එම කොන්දේසි සඳහන් කිරීම;

(ඇ) මේ පනත යටතේ හෝ බලය ලත් තැනැත්තන් විසින් හෝ අවසර පත්‍ර දරන්නන් වෙත නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවල කොන්දේසි වලට අනුකූලව ඔවුන්ගේ ක්‍රියා කිරීම අවලෝකනය කිරීම සහ යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව එලෙස ක්‍රියා කිරීම ක්‍රියාත්මක කිරීම ;

(ඈ) බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරනු ලැබිය හැකි මගී සේවා අවසරපත්‍රවල ආකෘතිය නියම කිරීම;

(ඉ) බලයලත් තැනැත්තකු විසින් මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු නිශ්චය කිරීම;

ඊ) මගී සේවා අවසරපත්‍රයක් සඳහා ඉල්ලුම්කරුවකු විසින් බලයලත් තැනැත්තකු වෙත ඉදිරිපත් කරනු ලැබියයුතු, වාහන යෝග්‍යතාවට, මඟින් ගෙනයාමේ ධාරිතාවය හා රියැදුරු යෝග්‍යතාවයට අදාල ලේඛණ සඳහන් කිරීම ;

(උ) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි යම් වාර වාර්තා සහ තොරතුරු කොමිෂන් සභාව වෙත සපයන ලෙස බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරන ලද මගී සේවා අවසරපත්‍ර දරන්නන්ට නියම කිරීම;

(i) තැපැල් ගෙනයාම; සහ

(ii) පාසල් ළමයින් සඳහා සහ විශ්ව විද්‍යාල වල, කාර්මික ආයතන වල සහ ඒ හා සමාන වෙනත් ආයතනවල ශිෂ්‍යයන් සඳහා අනුග්‍රාහක ගාස්තු මත පාසල් සේවා සැලැස්වීම ඇතුලුව ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ ආයතන වලට අවශ්‍ය බස්රථ සේවා සම්බන්ධයෙන් ඒ දෙපාර්තමේන්තු, ආයතන සහ බලයලත් තැනැත්තන් සමග සම්බන්ධතා ඇතිකර ගැනීම.

(එ) නිශ්චිත ප්‍රදේශයෙහි බස්රථ සඳහා මගී සේවා අවසරපත්‍ර ප්‍රදානය කිරීම ;

(ඒ) බස් සේවා සැපයීම සඳහා තරඟකාරී ඉල්ලුම් සලකා බැලීමෙන් පසුව තැනැත්තන් සමග ගිවිසුම්වලට ඇතුළත් වීමෙන් ලාභ නොලබන මාර්ගවල බස්රථ සේවා සැලසෙන බවට වගබලා ගැනීම සහ අවශ්‍ය විටෙක, එවැනි සේවා සලසන තැනැත්තන්ට මූල්‍යාධාර සැලසීම සහතික කිරීම සහ සලකනු ලබන සේවාවල ස්වභාවය කෙරෙහි සැලකිලිමත්ව, එම තැනැත්තන් විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු නිශ්චය කිරීම;

(ඔ) අන්තර් පළාත් බස්රථ සේවා සැලසීම හා ඒ සම්බන්ධයෙන් මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා යම් තැනැත්තකු සමග ගිවිසුම් වලට ඇතුළත් වීම;

(ඕ) බලයලත් තැනැත්තන්ට කළමනාකරණ විශේෂඥතා හා සහාය සහ බස්රථ සේවා සැලසීමට අදාලව බලයලත් තැනැත්තන්ගේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය වියහැකි වෙනත් යම් සහාය හෝ උපදෙස් සැපයීම;

(ක) බස් රථ වල භාණ්ඩ ගෙනයාම සඳහා කටයුතු පිළියෙල කිරීම.

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය :-

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම

(ආ) කොමිෂන් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම

(ඇ) කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරන ලද නිලධරයන්ගේ හා සේවකයන්ගේ කෞශල්‍යය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා කවර හෝ දෙයක් කිරීම

(ඈ) කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම

(ඉ) කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් සඳහා සුභ සාධක විනෝදාංශ පහසුකම් සැපයීම

(ඊ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට කෙළින්ම හෝ තත්කාර්යය සඳහා බලය දී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු හෝ මගින් එළඹීම සහ ඒ ගිවිසුම් ඉටුකිරීම

(උ) කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් පත්කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම්, ඔවුන්ගේ විනය පාලනය, හැසිරීම සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, ඒ නිලධරයන්ට හා සේවකයන්ට අදාළ රීති සැදීම

(ඌ) මගීසේවා අවසරපත්‍ර දරන්නන් විසින්, බස්රථ සේවා සැලසීමට අදාළ ස්වකීය කටයුතු නිසි පරිදි ඉටු කළහැකි වනු පිණිස ඒ අවසරපත්‍ර දරන්නන්ට ඉංජිනේරු, තාක්ෂණික නීතිමය, වෛද්‍ය සහ මූල්‍ය ආධාර සහ උපදෙස් සැපයීම

(එ) කොමිෂන් සභාවේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා කොමිෂන් සභාවේ මතය අනුව අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම

කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය



ශශී වෙල්ගම මහතා
සභාපති,

ජාතික ගමනාගමන කොමිෂන් සභාව



ආචාර්ය රංජිත් ජී රුබසිංහ මහතා
සභාපති,
ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය



කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මහත්මිය
අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය



කේ.ජී. සුමුදු දිනේෂා මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන),

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය



එස්. ජලදීපන් මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
මුදල් අමාත්‍යාංශය



එස්.ආර්. ගොඩමුණේ මහතා
අධ්‍යක්ෂ,

නිශානීස් පුද්ගලික සමාගම



බී අමිල රන්මණ්ඩල මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය



එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා
කළමණාකාර අධ්‍යක්ෂ,

සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම

2023 ජනවාරි සිට 2023 පෙබරවාරි දක්වා

1.	ශශී වෙල්ගම මහතා සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සභාපති
2.	ටී.එම්.ජේ. බණ්ඩාර මහතා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	-සාමාජික (නිලබලයෙන්)
3.	එස්. ජලදීපන් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, මුදල් අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
4.	නයෝමි ජයවර්ධන මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
5.	එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා කළමණාකාර අධ්‍යක්ෂ, සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම	-සාමාජික
6.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික
7.	රංජිත් ජී රූබසිංහ මහතා සභාපති, ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය	-සාමාජික
8.	අමිල රන්මණ්ඩල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය	-සාමාජික

2023 පෙබරවාරි සිට 2023 සැප්තැම්බර් දක්වා

1.	ශශී වෙල්ගම මහතා සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සභාපති
2.	ටී.ඒ. ඩී.ඩී. ප්‍රේමරත්න මහතා අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
3.	නයෝමි ජයවර්ධන මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
4.	එස්. ජලදීපන් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, මුදල් අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
5.	එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා කළමණාකාර අධ්‍යක්ෂ, සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම	-සාමාජික
6.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික
7.	රංජිත් ජී රූබසිංහ මහතා සභාපති, ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය	-සාමාජික
8.	බී අමිල රන්මණ්ඩල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය	-සාමාජික

2023 සැප්තැම්බර් සිට 2023 නොවැම්බර් දක්වා

1.	ශශී වෙල්ගම මහතා සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සභාපති
2.	ටී.ඒ. ඩී.ඩී. ප්‍රේමරත්න මහතා අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
3.	එස්. ජලදීපන් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, මුදල් අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
4.	කේ.ජී. සුමුදු දිනේෂා මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
5.	එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා කළමණාකාර අධ්‍යක්ෂ, සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම	-සාමාජික
6.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික
7.	රංජිත් ජී රූබසිංහ මහතා සභාපති, ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය	-සාමාජික
8.	අමිල රන්මණ්ඩල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය	-සාමාජික

2023 නොවැම්බර් සිට 2023 දෙසැම්බර් දක්වා

1.	ශශී වෙල්ගම මහතා සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සභාපති
2.	කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මහත්මිය අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
3.	එස්. ජලදීපන් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, මුදල් අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
4.	කේ.ජී. සුමුදු දිනේෂා මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
5.	එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා කළමණාකාර අධ්‍යක්ෂ, සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම	-සාමාජික
6.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික
7.	රංජිත් ජී රූබසිංහ මහතා සභාපති, ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය	-සාමාජික
8.	අමිල රන්මණ්ඩල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය	-සාමාජික

සභාපතිතුමාගේ පණිවිඩය



1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව ස්ථාපිත කරන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ශ්‍රී ලාංකික ජන සමාජය වෙත කාර්යක්ෂම හා සුවපහසු ප්‍රවාහන සේවාවක් උරුම කරදීමේ අභිලාශයන් සාක්ෂාත් කරගැනීමේ අරමුණින් 2023 වර්ෂය තුළද විවිධ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත.

පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයන් භාවිතා කරන ජනතාව අතර පොදු මගී ප්‍රවාහන සේවය ප්‍රචලිත කර ඔවුන් ඒ වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා, පොදු බස් ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීම පිණිස 2023 වර්ෂයේ නවීන තාක්ෂණ ක්‍රමෝපායන් උපයෝගී කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව බස් සේවාවන්හි නියමිත කාලසටහන් වලට අනුකූලව, නියමාකාර වේග සීමාවන් අනුගමනය කරමින්, නියමිත ගමනාන්තය කරා ආරක්ෂාකාරීව ගමන් කරන්නේද යන්න සොයාබැලීම සඳහා GPS තාක්ෂණය උපයෝගී කර ගැනීම වඩාත් පුළුල් කරන ලද අතර එම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන GPS මෙහෙයුම් මැදිරිය පවත්වාගෙන යනු ලැබීය. මගීන්ගේ පහසුව සඳහා නියමිත බස් ගාස්තුව ඉලෙක්ට්‍රොනික කාඩ්පතක් මගින් ගෙවීම සඳහා අවස්ථාව සැලසීමට, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය හා එක්ව කටයුතු ආරම්භ කර ඇත. තවද මගී ජනතාවගේ අවශ්‍යතාවය අනුව බස්රථ සේවා පිළිබඳ තොරතුරු ස්මාර්ට් ජංගම දුරකථන මගින් ලබා ගැනීමට හැකි මෘදුකාංග වැඩිදියුණු කිරීමත්, ආසන වෙන් කරවා ගැනීමටත් පැමිණිලි, ප්‍රශ්න හා ගැටළු පහසුවෙන් හා ක්ෂණිකව ඉදිරිපත් කිරීමටත් විසඳුම් ලබා ගැනීමටත් හැකි නවතාක්ෂණික පහසුකම් මගී ජනතාව වෙනුවෙන් සලසා දීමට කටයුතු කර ඇත. විද්‍යාත්මක ඒකාබද්ධ චක්‍රීය කාලසටහන් සකස් කිරීමේ ව්‍යාපෘතියට අදාලව දිවයිනේ සියළු අන්තර් පළාත් මාර්ග ආවරණය වන පරිදි මගී ඉල්ලුම හඳුනා ගැනීමේ සමීක්ෂණ සිදු කර අවසන් කර ඇති අතර ඒ අනුව ඒකාබද්ධ කාලසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

රාජ්‍ය භාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ‘සමාජීය අවශ්‍යතාවයන් සපුරාලීම අරමුණු කොට ගත් ව්‍යාපෘති’ වශයෙන් පාසල් සිසුන්ට මානසික හා කායික අපහසුතාවයන්ගෙන් තොරව කලට වේලාවට පාසලට යාමේ සහ ආරක්ෂාකාරීව ආපසු නිවෙස් බලා පැමිණීමේ පහසුකම් සැලසීම අරමුණු කරගෙන ‘සිසු සැරිය’ බස් රථ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාමත්, ප්‍රවාහන පහසුකම් නොමැති පෙදෙස් වල වෙසෙන ජනතාවට තම දෛනික අවශ්‍යතාවන් සඳහා විශ්වාසදායී ප්‍රවාහන

සේවයක් සැලසීම අරමුණු කරගෙන ‘ගැමි සැරිය’ බස්රථ සේවාව පවත්වාගෙන යාමත්, රාත්‍රී කාලයේ සහ හිමිදිරි උදෑසන බස් සේවාවල පවතින හිඟකම නිසා මගීන්ට මුහුණ පෑමට සිදුවන අපහසුතා මගහැරවීම සඳහා ‘නිසි සැරිය’ බස් සේවාව ක්‍රියාත්මක කරන ලදී.

පළාත් ප්‍රවාහන අධිකාරින්හි කළමනාකාරිත්වය, අන්තර් පළාත් බස්රථ හිමිකරුවන්, පාසල් රථ නියාමක කණ්ඩායම් ඇතුළු මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන් ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා 2023 වර්ෂයේද වැඩමුළු ගණනාවක් පැවැත්වීමට කටයුතු කර ඇත.

එමෙන්ම ප්‍රවාහනය සම්බන්ධ සැලසුම් සකස් කිරීමේදී සංඛ්‍යාලේඛන සඳහා හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. මේ නිසා ප්‍රවාහනය සම්බන්ධ සියලු දත්ත එක්තැන් කළ වාර්තාවක් වශයෙන් ප්‍රවාහන සංඛ්‍යා ලේඛන වාර්තාව 2023 වර්ෂයේද ප්‍රවාහනයට සම්බන්ධ රාජ්‍ය ආයතන ගණනාවකින් සංඛ්‍යා දත්ත එක්රැස් කර පුළුල් විෂය පථයක් ආවරණය වන පරිදි එළි දැක්වීම ද සිදු කරන ලදී.

ඒ අනුව මෙම සියලුම ව්‍යාපෘති තුළින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීම, ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම අරමුණු කෙරේ.

රාජ්‍ය ප්‍රත්පත්තිය නිසි ලෙස අනුගමනය කරමින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා නවීන තාක්ෂණය වැඩිවැඩියෙන් උපයෝගී කර ගැනීමටත් ඒතුලින් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමටත් අනුග්‍රහය ලබා දුන් ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාටත්, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ටත්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සමස්ථ කාර්යමණ්ඩලයටත් නන් අයුරින් සහයෝගය දක්වන ලද ශ්‍රී ලංගම හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවල සභාපතිවරුන් ඇතුළු එම ආයතන වල සියළු කාර්ය මණ්ඩලවලටත්, පෞද්ගලික බස්රථ හිමිකරුවන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල ඇතුළු අනෙකුත් සියළු පාර්ශවයන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කර සිටිමි.

ශශී වෙල්ගම
සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

විගණන හා කළමනාකරණ කමිටු සාමාජික මණ්ඩලය

පළමු හා දෙවන කමිටු රැස්වීම්

1.	ටී.ඒ. ඩී.ඩී. ප්‍රේමරත්න මහතා අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	කමිටු සභාපති
2.	නයෝමි ජයවර්ධන මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	-සාමාජික
3.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික

තෙවන කමිටු රැස්වීම

1.	ටී.ඒ. ඩී.ඩී. ප්‍රේමරත්න මහතා අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	කමිටු සභාපති
2.	කේ.ජී. සුමුදු දිනේෂා මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	-සාමාජික
3.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික

සිව්වන කමිටු රැස්වීම

1.	කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මහත්මිය අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	කමිටු සභාපති
2.	කේ.ජී. සුමුදු දිනේෂා මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	-සාමාජික
3.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික


කොමිෂන් සභාවේ සංයුතිය

කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 224 ක් වන අතර 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සේවයේ යෙදී සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 173 ක් විය.

2023.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව

අනු අංකය	තනතුරු නාමය	සේවක කාණ්ඩය	අනුමත කාර්ය මණ්ඩලය	**2023.12.31** දිනට සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලය	**2023.12.31** දිනට පැවති සේවක පුරප්පාඩු	**2023.12.31** දිනට කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලය
01	අධ්‍යක්ෂ ජනරාල්	HM 2 -1	01	01	-	-
02	අධ්‍යක්ෂ	HM 1-1	04	04	-	-
03	සහකාර අධ්‍යක්ෂ	MM 1-1	17	12	5	-
04	කණිෂ්ඨ කළමනාකාර	JM 1-1	21	17	4	-
05	ප්‍රවාහන පද්ධති විශ්ලේෂක	MA 4	36	30	6	-
06	කළමනාකරණ සහකාර	MA 2-1	03	0	3	-
07	කළමනාකරණ සහකාර	MA 1-1	81	66	15	-
08	රියැදුරු	PL 3	13	13	0	-
09	කාර්යාල කාර්ය සහායක	PL 1	15	14	1	-
10	වේලා සටහන්කරු	PL 1	33	16	17	1
	එකතුව		**224**	**173**	**51**	**1**

මූලාශ්‍රය - පාලන දෙපාර්තමේන්තුව, ජාගකොස


NTC - Organization Structure
Chairman
Director General
Director Planning
Director Q.A.
Director Operation
Director F & P
Internal Auditor
AD/ Legal
AD Admin.
AD/ Procure.
AD Planning
AD QA
AD IT
AD Operation
Accountant
Finance Assistant
Procurement Officer
Administrative Officer
Legal Officer
Transport Engineer
Junior Manager
Network Administrator
Junior Manager
Junior Manager
Transport System Analyst
Transport System Analyst
Transport System Analyst
Transport System Analyst
Transport System Analyst
Transport System Analyst
Transport System Analyst
Transport System Analyst
Mgt. Asst.
Mgt. Asst.
Mgt. Asst.
Mgt. Asst.
Mgt. Asst.
Mgt. Asst.
Mgt. Asst.
Mgt. Asst.
ICT. Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst.
Office Asst./ Time Keepers
Drivers
Handy Man
HM- 2.1
HM- 1.1
MM- 1.1
JM- 1.1
MA-4
MA 2.1
MA 1.1
PL3
PL1

2023 වර්ෂයේ කාර්යසාධනය

බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, රජයට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවා ඇත.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත පිළිවෙලින් 1996 අංක 30 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මගින්ද 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල පනත මගින්ද 2017 අංක 6 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මගින්ද සංශෝධනය වී ඇත.

එමගින් පැවරී ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍යයන්ට අනුකූලව සහ පනත අනුව සිදු කළ යුතු විශේෂ කාර්යයන් සම්බන්ධයෙන් ලබාගෙන ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතීන්ට අනුකූලව ශ්‍රී ලාංකික ජනතාවට කාර්‍යක්ෂම, ඉහළ ප්‍රමිතියකින් යුත් පරිසර හිතකාමී, සුවපහසු ප්‍රවාහන සේවාවක් ලබාදීමට සහ ප්‍රවාහනයට නූතන ප්‍රවේශයක් ඇති කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව තුළ ස්ථාපිත ධාවන හා සේවා අධීක්ෂණ, සැලසුම්, තත්ත්වාරක්ෂණ හා බාහිර සම්බන්ධතා සහ පාලන යන දෙපාර්තමේන්තු මගින් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කර ඇත.

එම ව්‍යාපෘති වල 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ප්‍රගතිය පහත දක්වා ඇත.




01.

ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව



1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මගින් පැවරී ඇති කර්තව්‍යයන් අනුව, බස්රථ මගින් මගී ප්‍රවාහන සේවාවන්ට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය කෙරෙහි සැළකිල්ල ඇතිව, මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස පිළිගත හැකි තත්ත්වයකින් යුත් බස්රථ සේවා පවතින්නේද යන වග අවලෝකනය කිරීම කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වේ.

ඒ අනුව, අන්තර් පළාත් මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම, යාවත්කාලීන කිරීම හා බස්රථ මෙහෙයවීම පසුවිපරම් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. එම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

	**අන්තර්පළාත් බස්රථ සේවා සැපයීම සඳහා මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම, යාවත්කාලීන කිරීම සම්බන්ධ කාර්යයන්**
	**දිවයින පුරා මගී ප්‍රවාහන බස්රථ 'ඔම්නි' බදු පංතියට ඇතුළත් කිරීම සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම.**
	**අන්තර්පළාත් දුර සේවා බස්රථ වල පිරිවිතර පරීක්ෂා කිරීම**
	**බස්රථ සේවා මෙහෙයුම් කටයුතු**
	**උත්සව කාල සඳහා විශේෂ බස්රථ සේවා**

	**අන්තර් පළාත් බස්සේවා සඳහා අඛණ්ඩව සිදු කරන්නා වූ ජංගම පරීක්ෂණ**
	**මහජන පැමිණිලි ලබා ගැනීම හා විමර්ශනය කිරීම**

1.1 අන්තර් පළාත් බස්රථ සේවා සැපයීම සඳහා මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම, යාවත්කාලීන කිරීම සම්බන්ධ කාර්යයන්

2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 37 වන වගන්තිය මගින් 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 18 වැනි වගන්තිය සංශෝධනය කර ඇති අතර ඒ අනුව පළාත් දෙකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාව සතුවන අතර 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව අන්තර් පළාත් බස්රථ මගී ප්‍රවාහනය සඳහා මගීසේවා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ.

“මගීසේවා අවසරපත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ඉල්ලුම් පත්‍රයෙහි ඉල්ලා ඇති මාර්ගයේ හෝ මාර්ගවල බස් රථ සේවා සඳහා මහජනතාවගේ ඉල්ලුම කෙරෙහි සැලකිලිමත්ව, කොමිෂන් සභාව විසින් මගීසේවා අවසරපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ඒ අවසර පත්‍රය ප්‍රදානය කිරීමෙන් ඉල්ලා ඇති මාර්ගය සඳහා අවශ්‍ය ප්‍රමාණය ඉක්මවන බස් රථ සංඛ්‍යාවක් යෙදවීමේ ප්‍රතිඵලය ඇතිවන බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම් අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමට ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය හැකිය.“

මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම, විවෘත හා විනිවිදභාවයකින් සිදු කිරීමේ අරමුණින් 2005 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/05/1461/031/36 යටතේ විවෘත ටෙන්ඩර් ක්‍රමවේදය හඳුන්වා දුන් අතර, එය 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවති

එම ක්‍රමවේදය සාමාලෝචනය කර නව ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා පත්කර ඇති කමිටුව විසින් නව ක්‍රමවේදයක් සකස් කර හඳුන්වා දෙන තුරු, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1563/608/056 වූ, “ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ අන්තර් පළාත් බස්රථ ධාවනය සඳහා නිත්‍ය මගීසේවා අවසර පත්‍ර නිකුත් කිරීම” යන මැයෙන් ප්‍රවාහන හා මහාමාර්ග ඇමතිතුමා ඉදිරිපත් කළ 2022.09.30 දිනැති සංදේශය සඳහා ලැබී ඇති අනුමැතිය අනුව, මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා නව ක්‍රමවේදය හඳුන්වා දෙන තුරු විවෘත ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ නව මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා 2023.07.10 දින මිල ගණන් කැඳවන ලදි.

තාවකාලික අවසර පත්‍ර යටතේ ධාවනය වූ ධාවකයින් මෙම ටෙන්ඩර් කැඳවීමට විරුද්ධව ගරු අධිකරණයට නඩුකරයක් ගොනු කළ බැවින් මෙම ටෙන්ඩරය විවෘත කිරීම තාවකාලිකව අත්හිටුවන ලදි.

මෙම ටෙන්ඩරයට විරුද්ධව CA(W) 414/2023, CA(W) 415/2023 , CA(W) 416/2023 හා CA(W) 423/2023 යටතේ නඩු 04ක් ගොනු කළ අතර, තාවකාලික අවසර පත්‍ර යටතේ බස්රථ සේවා පවත්වාගෙන යන බස් හිමියන්ට ස්ථිර බලපත්‍ර ලබා දීමට ගත් තීරණය මත CA(W) 415/2023 හා (CAW) 416/2023 අංක දරණ නඩුකර සමතයකට පත් කර ඇත. ඒ අනුව 2023.12.31 වන විට තාවකාලික අවසර පත්‍ර යටතේ ධාවනය වූ අවසර පත්‍ර 34ක් ස්ථිර කර ලබා දී ඇත.

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/2217/608/015 –II වූ,” ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් අන්තර් පළාත් මගීසේවා අවසරපත්‍ර ලබාදීමේදී අනුගමනය කිරීමට යෝජිත ක්‍රමවේදය නැවත සමාලෝචනය කිරීම යන මැයෙන් ප්‍රවාහන හා මහාමාර්ග ඇමතිතුමා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023 නොවැම්බර් මස 11 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එදිනෙන් පසුව මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමේදී එම අමාත්‍ය මණ්ඩල අනුමැතියේ සඳහන් නව ක්‍රමවේදය අනුගමනය කිරීම සිදු කරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දින වන විට වලංගු මගී සේවා අවසර පත්‍ර සංඛ්‍යාව 3,151ක් වන අතර එසේ අවසරපත්‍ර නිකුත් කර ඇති බස් රථ සේවා වර්ග 4කි. එනම්, බස් රථය තුළ පවතින සුවපහසුව අනුව සාමාන්‍ය සේවා, අර්ධ සුඛෝපභෝගී සේවා, සුඛෝපභෝගී සේවා හා අධි සුඛෝපභෝගී සේවා වශයෙන් සේවා වර්ග කර ඇත.








2023.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වලංගු මගීසේවා අවසරපත්‍ර සංඛ්‍යාව එක් එක් බස් සේවා අනුව පහත දක්වා ඇත.


අනු අංකය	සේවා වර්ගය	බස්රථ සංඛ්‍යාව
1	සාමාන්‍ය	1985
2	අර්ධ සුඛෝපභෝගී	431
3	සුඛෝපභෝගී	557
4	අධි සුඛෝපභෝගී	178
එකතුව		**3151**



1.2 දිවයින පුරා මගී ප්‍රවාහන බස්රථ 'ඔම්නි' බදු පංතියට ඇතුළත් කිරීම සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම.

මගී ප්‍රවාහන සේවාහි යොදවනු ලබන බස්රථ 'ඔම්නි' බස් රථයක් වශයෙන් මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කර තිබීම අනිවාර්යය වේ. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ හා පළාත් මගී ප්‍රවාහන අධිකාරී නවය යටතේ මගීසේවා අවසරපත්‍ර ලබා දිවයින පුරා ධාවනය වන පෞද්ගලික බස්රථ "ඔම්නි " බස්රථයක් වශයෙන් ලියාපදිංචි කිරීමට අදාළ නිර්දේශ ලිපිය මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

1.3 අන්තර් පළාත් දුර සේවා බස්රථ වල පිරිවිතර පරීක්ෂා කිරීම


ජාතික ගමනාගමන කොමිෂන් සභාව
බස්රථ පරීක්ෂණ වාර්තාව

අන්තර් පළාත් දුර සේවා ධාවනය කරනු ලබන බොහෝ බස්රථ අඛණ්ඩව පැය ගණනාවක් ධාවනයේ යෙදෙන බැවින් එම බස්රථ වල ගමන්ගන්නා මගීන්ට කායික මානසික අපහසුතාවයකින් තොරව හා ආරක්ෂිතව ගමනාන්තය බලා යාමට අවස්ථාව සැලසීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රමුඛතම වගකීම වේ. එබැවින් අන්තර්පළාත් මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමේදී අදාල බස්රථවල පිරිවිතර පරීක්ෂා කර නියමිත පිරිවිතර මට්ටමට ඇති බව තහවුරු කර ගැනීම අනිවාර්ය වේ.

1.4 බස්රථ සේවා මෙහෙයුම් කටයුතු

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගීසේවා අවසර පත්‍ර යටතේ අන්තර් පළාත් මාර්ග 450 කට ආසන්න සංඛ්‍යාවක මගීසේවා අවසරපත්‍ර 3,200 ක් පමණ බස්රථ ධාවනය කරවනු ලබන අතර ඉන් මගීසේවා අවසරපත්‍ර 1,800 කට අදාළ බස්රථ සංඛ්‍යාවක් කොළඹ බැස්ටියන් මාවත බස් පර්යන්තයෙන් ගමන්ආරම්භ කරනු ලබයි. ඒ අනුව දිවයින පුරා ක්‍රියාත්මක අන්තර් පළාත් බස්රථ සේවාවලින් සියයට පනහකටත් වඩා කොළඹ බැස්ටියන් මාවත බස් පර්යන්තයෙන් ගමන් ආරම්භ කරන අතර එහෙයින් කොළඹ බැස්ටියන් මාවත පෞද්ගලික බස් පර්යන්තය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වේ. මීට අමතරව වව්නියාව දුරසේවා බස්රථ අංගනයේ ධාවන කටයුතු මෙහෙයවීම සහ එම ස්ථාන නඩත්තු කටයුතු සිදු කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. තවද මාකුඹුර, කඩුවෙල හා කඩවත බස්නැවතුම්පළ වලින් අධිවේගී මාර්ග හරහා සිදුකරනු ලබන අන්තර් පළාත් බස්රථ සේවා මෙහෙයවීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.



1.5 උත්සව කාල සඳහා විශේෂ බස්රථ සේවා

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් පවතින විවිධත්වය හේතුවෙන් බොහෝ ආගමික හා සංස්කෘතික උත්සව අවස්ථා දක්නට ලැබේ. ඒ අතරින් සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය දිවයිනේ බහුතර ජනතාවක් එක්ව සමරන හෙයින් මෙම කාල සීමාව තුළ තම ගම්බිම් බලා යාමට හා උත්සව කාලය අවසානයේ නගරය බලා ආපසු පැමිණීමටද විශාල ජනතාවක් මහමගට පැමිණේ. එසේ පැමිණෙන ජනතාවට මහත් සහනයක් වෙමින් 2023 වර්ෂයේද සිංහල හා දෙමළ අලුත් අවුරුදු කාල සීමාවේදී දිවයිනේ සෑම ප්‍රදේශයකටම අවශ්‍ය ප්‍රමාණයට බස්රථ සේවා අඛණ්ඩව සැපයීමේ ‘විශේෂ අලුත් අවුරුදු බස්රථ සේවා’ ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, බස්රථ 7,796ක් යොදවා මගින් 225,000කට පමණ, බැස්ටියන් මාවත ප්‍රධාන බස් නැවතුම්පල, මාකුඹුර, කඩවත, කඩුවෙල යන ස්ථාන වල සිට බස්රථ පහසුකම් සපයන ලදී.


බස් පර්යන්තය	බස්රථ ගමන්වාර සංඛ්‍යාව	මගීන් සංඛ්‍යාව
බැස්ටියන් මාවත	6,550	189,242
මාකුඹුර	297	13,552
වව්නියාව	590	6,950
කඩවත	241	10,296
කඩුවෙල	118	4,530
එකතුව	**7,796**	**224,570**


1.6 අන්තර් පළාත් බස්සේවා අධීක්ෂණ කටයුතු

1.6.1 අන්තර් පළාත් බස්සේවා සඳහා අඛණ්ඩව සිදු කරන්නා වූ ජංගම පරීක්ෂණ

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් පැවරී ඇති කර්තව්‍යයන්හි (ඇ) යටතේ " මේ පනත යටතේ හෝ බලය ලත් තැනැත්තන් විසින් හෝ අවසර පත්‍ර දරන්නන් වෙත නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවල කොන්දේසි වලට අනුකූලව ඔවුන්ගේ ක්‍රියා කිරීම අවලෝකනය කිරීම සහ යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව එලෙස ක්‍රියා කිරීම ක්‍රියාත්මක කිරීම" යන්න දක්වා ඇත. ඒ අනුව,

පොදු මගී ප්‍රවාහන සේවා වලින් තම ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගන්නා මගීන්ට ගුණාත්මක,ආරක්ෂාකාරී, සුවපහසු, පොදු ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මගී සේවා අවසරපත්‍ර යටතේ ධාවනය කරනු ලබන බස්රථ සඳහා අනුගමනය කලයුතු කොන්දේසි මාලාවක් පනවා ඇති අතර එම කොන්දේසිවලට අනුකූලව බස්රථ ධාවනය කරන්නේද යන්න පරීක්ෂා කිරීමත් සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය ව්‍යාපෘති වලට අදාල බස්රථ සේවා අදාල කොන්දේසි ප්‍රකාරව ධාවනය කරන්නේද යන්න පරීක්ෂා කිරීමත් ජංගම පරීක්ෂණ ඒකකය මගින් සිදු කරනු ලැබේ. එම පරීක්ෂණ වලදී අවසරපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් අන්තර් පළාත් බස්රථ ධාවනය කරන බවට අනාවරණය වුවහොත් අදාල බස්රථ පිළිබඳව විමර්ශනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මගී ජනතාවට උසස් ගුණාත්මක භාවයකින් යුත් පොදු ප්‍රවාහන සේවාවක් සැපයීමට කටයුතු කරනු ලැබේ.








ජංගම පරීක්ෂණ අංශය මගින් මාර්ගස්ථව පරීක්ෂා කරනු ලබන බස්රථ වල හඳුනාගන්නා මගී සේවා අවසරපත්‍ර කොන්දේසි කඩකිරීම් සටහන් කර ජංගම පරීක්ෂණ වාර්තාවක් අදාල බස්රථය වෙත නිකුත් කරනු ලැබේ. ඒ අනුව අදාල අවසරපත්‍ර හිමිකරු කැඳවා විමර්ශනයක් සිදු කර තහවුරු කරගන්නා අවසරපත්‍ර කොන්දේසි කඩකිරීම් සඳහා පරිපාලන ගාස්තු අයකිරීම, කොන්දේසි කඩ කරන රියදුරු කොන්දොස්තර මහතුන් කාර්යාලයට කැඳවා අවවාද කිරීම, රියදුරු/කොන්දොස්තර දඬුවම් පුහුණු වෙත යොමු කිරීම, කඩ කරන ලද අවසරපත්‍ර කොන්දේසි අනුව පරිපාලන ගාස්තු අයකිරීම්, සේවක මණ්ඩලවල සේවා අත්හිටුවීම්, රියදුරු/කොන්දොස්තර ප්‍රවීණතා කාඩ්පත් අසාධු ලේඛණගත කිරීම් වැනි ක්‍රියාමාර්ග මෙන්ම අවසරපත්‍ර ගමන්වාර අත්හිටුවීම් හා මගීසේවා අවසර පත්‍ර අවලංගු කිරීම් දක්වාද කටයුතු කරනු ලබයි. මගී සේවා අවසර පත්‍ර අත්හිටුවීම මෙන්ම අවලංගු කිරීම් සිදුකිරීමද මේ ඒකකය යටතේ සිදුකරනු ලබයි.

2023 වර්ෂය තුල අන්තර්පළාත් ධාවනය වන බස්රථ 10,043 වරක් ජංගම පරීක්ෂණ නිලධාරීන් විසින් පරීක්ෂා කර ඇති අතර ඉන් අවස්ථා 2,136 ක් පමණ කොන්දේසි උල්ලංඝණය කර ධාවනය කර ඇති බවට වාර්තා වී ඇත.



1.6.2 මහජන පැමිණිලි ලබා ගැනීම හා විමර්ශනය කිරීම



ගුණාත්මක මගී ප්‍රවාහනය සේවාවක් මගී ජනතාවට ලබාදීම සඳහා පොදු ප්‍රවාහන සේවාවේ තත්ත්වය ඉතා සියුම්ව නිරීක්ෂණය කළ හැකි මාධ්‍යක් වශයෙන් මෙම සේවාවෙන් ලැබෙන මහජන ප්‍රතිචාර ඉතා වැදගත්වේ.

ඒ අනුව බස්රථවල ගමන්කරන මගීන් ඔවුන් ලබාගන්නා සේවාව සම්බන්ධව හා එම බස්රථවල සේවක කණ්ඩායම්හි හැසිරීම සම්බන්ධව යම් ගැටළුකාරී තත්ත්වයන් ඇති වුවහොත් ඒ සම්බන්ධව

පැමිණිලි කිරීමට මහජන පැමිණිලි ඒකකයක් ආයතනය තුළ ස්ථාපිතකර ඇත. පොදු මගී ප්‍රවාහන සේවා මගින්, ගමන් පහසුව සලසා ගන්නා මගීන් හට එකී බස් රථයේදී මුහුණදීමට සිදුවන ගැටළු සහ බස්රථ සේවක කණ්ඩායම විසින් සිදුකරනු ලබන අසාධාරණ, අයුක්තිසහගත ක්‍රියාවන් පිළිබඳ සිදුවීමකදි පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසා දි ඇත.


ඒ අනුව පැමිණිලි ලැබෙන මාධ්‍යන් ලෙස 1955 ක්ෂණික දුරකථන ඇමතුම් ඒකකය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමට අමතරව ලිඛිතව, ෆැක්ස් මාර්ගයෙන්, විද්‍යුත් තැපෑල මගින්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා මෙන්ම My Bus-SL යෙදුම, WhatsApp හා සමාජ මාධ්‍ය (Facebook Page) මගින් පැමිණිලි ලබා ගැනීම සිදු කරයි. එහිදී පැය 24 පුරාම දින 07 තුල ක්‍රියාත්මක වන 1955 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් මගී ජනතාවට අවශ්‍ය තොරතුරු සැපයීම හා බස්රථ සේවා සඳහා වන පැමිණිලි ස්වයංකරණ පද්ධතියට ගොනු කරන අතර පැමිණිල්ල ස්වයංකරණ පද්ධතියට එක්කළ වහාම පැමිණිලිකරුගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් හරහා පැමිණිල්ලට අදාල විමසීම් අංකය යවනු ලැබේ. එලෙස ලැබෙන පැමිණිලි එම අවස්ථාවේදීම පැමිණිලි විමර්ශන ඒකකය වෙත ස්වයංක්‍රියව යොමුකරනු ලබන අතර ඉදිරි විමර්ශන කටයුතු මහජන පැමිණිලි විමර්ශන ඒකකය මගින් සිදු කරනු ලැබේ.

මෙම ලැබෙන පැමිණිලි වලින් අන්තර් පළාත් බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේම විභාග කරන අතර, පළාත් මගී ප්‍රවාහන අධිකාරී බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි එම අධිකාරීන් වෙත යොමුකරනු ලබයි. එසේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා ලැබෙන පැමිණිලි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත යොමුකරයි.
ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අන්තර් පළාත් බස්රථ සම්බන්ධව යොමුකරනු ලබන පැමිණිලි සියල්ල නිරීක්ෂණය කරන අතර, තව දුරටත් තොරතුරු ලබා ගත යුතු පැමිණිලි සඳහා පැමිණිලිකරුවන් දුරකතනයෙන් සම්බන්ධ කරගනිමින් තොරතුරු ලබා ගැනීම, විමර්ශන කටයුතු වලට අනුව අදාළ පාර්ශවයන් කැඳවිය යුතු පැමිණිලි සඳහා අදාළ පාර්ශවයන් කැඳවීම, වරදේ ස්වභාවය සහ බරපතලකම අනුව බස් රථ හිමියා/ සේවක කණ්ඩායමට අවවාද කළ යුතු පැමිණිලි සඳහා වාචික අවවාද කිරීම, ලිඛිත අවවාද කිරීම, රියදුරු/කොන්දොස්තර දඬුවම් පුහුණු වෙත යොමු කිරීම, පරිපාලන ගාස්තු අයකිරීම්, සේවක මණ්ඩලවල සේවා අත්හිටුවීම්, රියදුරු/කොන්දොස්තර ප්‍රවීණතා කාඩ්පත් අසාධු ලේඛණගත කිරීම් වැනි ක්‍රියාමාර්ග මෙන්ම අවසරපත්‍ර ගමන්වාර අත්හිටුවීම් සහ ඇතැම් අවස්ථාවලදී මගීසේවා අවසර පත්‍ර අවලංගු කිරීම් දක්වාද කටයුතු කරනු ලබයි. මෙසේ අයකරන ලද පරිපාලන ගාස්තු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

2023 වර්ෂයේ ජනවාරි මස 01 සිට 2023 දෙසැම්බර් මස 31 දක්වා ලද පැමිණිලි සංඛ්‍යාව 4,625ක් වන අතර එම පැමිණිලි වලට අදාල විෂමාචාර පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු වගුව පහත පරිදි වේ.

අනු අංකය	විස්තරය	සංකේත අංකය	ලද පැමිණිලි වලට අදාල විෂමාචාර සංඛ්‍යාව	ප්‍රතිශතය %
1	වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම	SE04	1098	18
2	මගීන්ට ආචාරශීලි නොවීම	MN12	530	9
3	නියමිත ප්‍රමාණයට වඩා වැඩි මගීන් රැගෙන යාම	MJ12	342	6
4	නියමිත පරිදි ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම	MJ11	691	11
5	නොසැළකිල්ලෙන් රිය පැදවීම/අධික වේගය/ ජංගම දුරකථනය භාවිතා කිරීම/තරඟකාරී ධාවනය/ සුළු අනතුරු	MJ17 -02	1065	18
6	රියැදුරු / කොන්දොස්තර ප්‍රවීණතා කාඩ් පත නොමැතිව සේවයේ යෙදීම	MJ07	65	1
7	අතරමඟ ස්ථානවල අනවශ්‍ය ආකාරයට බස්රථය නවත්වා මගීන් එකතු කිරීම	MN12-01	191	3
8	නියමිත කාලසටහන උල්ලංඝනය කිරීම	MJ01	355	6
9	නියමිත ස්ථානයෙන් ගමන් ආරම්භ නොකිරීම හා ගමනාන්තය දක්වා ධාවනය නොකිරීම	SE03	309	5
10	බස් රථය මගී ප්‍රවාහනයට සුදුසු තත්ත්වයේ නොතිබීම	MJ03	179	3
11	වායු සමීකරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම	MJ02	70	1
12	GPS උපාංග ක්‍රියාත්මක නොවීම	MN12-06	199	3
13	අධික ශබ්දයෙන් කැසට්/ රේඩියෝ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම/ නොගැලපෙන වීඩියෝ පට ප්‍රදර්ශනය	MN02	36	1
14	බස් ගාස්තු ප්‍රදර්ශනය නොකිරීම	MJ08	38	1
15	වෙනත්	other	868	14
එකතුව			**6036**	**100**

මූලාශ්‍රය - තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව, (ජා.ග.කොා.ස)



ඒ අනුව 2023 දෙසැම්බර් දින 31 දක්වා අන්තර් පළාත් පෞද්ගලික බස්රථවලදී මගී ජනතාව මුහුණදුන් විවිධ ගැටලු පාදක කරගෙන විෂමාචාර 6,036 ක් සිදුකළ බවට පැමිණිළි ඉදිරිපත්වී ඇති අතර, ඉන් වැඩිපුරම පැමිණිලි ලැබී ඇත්තේ වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම සම්බන්ධවයි.

තවද අන්තර් පළාත් පෞද්ගලික බස්රථ වලින් සිදුකරනු ලබන මාරක අනතුරු සම්බන්ධව ජාතික ගමනාගමන කොමිෂන් සභාව දැඩි ක්‍රියාමාර්ග ගනු ලැබේ. මාරක අනතුරක් වාර්තා වූ වහාම බස්රථයේ ධාවනය අත්හිටුවා පරීක්ෂණ කටයුතු ආරම්භ කරන අතර අධිකරණ වාර්තා හා පොලිස් වාර්තා අනුව මෙම අවසරපත්‍ර අවලංගුකිරීම් හා මාරක අනතුර සිදුකළ රියදුරන්ට නැවත පොදු ප්‍රවාහන සේවා බස්රථවල සේවය කිරීමට නොහැකි වන ආකාරයට සේවා ලියාපදිංචිය අවලංගු කර අසාදු ලේඛණගත කිරීම සිදුකරනු ලැබේ.

කිසිදු මහජන පැමිණිල්ලකින් තොරව ආරක්ෂාකාරී,සුවපහසු, විශ්වසනීය පොදු ප්‍රවාහන සේවාවක් ගෙවිය හැකි මුදලකට සැපයීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ඉලක්කයකි.

මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 9.5ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 6.302 ක් 2023.12.31 දින වන විට වැය වී ඇත. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 66 ක් වේ.









2.

සැලසුම් දෙපාර්තමේන්තුව





ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ පූර්විකාවෙහි,

(ආ) මහජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණයට සහ තත්ත්වයට බස්රථ මගින් මගී ප්‍රවාහනයට අදාල සේවාවන් දියුණු තත්ත්වයට නංවාලීම සහ එම සේවාවන් ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම සාධාරණ ලෙස ව්‍යාප්ත කිරීම,

(ඇ) සමාජයීය වශයෙන් අවශ්‍ය එහෙත් ලාභ නොලබන මාර්ග සේවා සහ ගමන්වාර, බස්රථ මගින් මගී ප්‍රවාහනයට අදාළ ප්‍රමාණවත් සේවාවන් මෙහෙයවීම සඳහා විධිවිධාන සැලැස්වීම හා

(ඇ) එම සේවාවන් සලසන තැනැත්තන් අතර, යහපත් තරහකාරිත්වයක් පවත්නා බවට වගබලා ගැනීම

යන කාර්යයන් ක්‍රියාවේ යෙදවීම සඳහා ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයන් වේ. තවද එසේ සැලසුම් කරනු ලබන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා වන අය වැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, එම ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා සකස් කිරීම, රේඛීය අමාත්‍යාංශය වෙත කලින් කලට අවශ්‍ය ප්‍රගති වාර්තා හා කාර්යසාධන වාර්තා සැපයීම, දිවයිනේ සමස්ථ පොදු ප්‍රවාහන පෞද්ගලික බස්රථ සේවා පිළිබඳ තොරතුරු රැස් කිරීම හා විශ්ලේෂණය කර වාර්තා සකස් කිරීමත් ආයතනයේ කාර්ය සාධනය ඇතුලත් වාර්ෂික වාර්තාව සකස් කිරීමත්, වැනි කාර්යයන් රැසක් මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලැබේ.

මීට අමතරව මගී අවශ්‍යතාවයට අනුව, පවත්නා බස් රථ මගී ප්‍රවාහන සේවා ප්‍රමාණවත්ද යනවග හා එම සේවාවන් සම්බන්ධයෙන් මගීන් තෘප්තිමත්ද යන වග අවලෝකනය කිරීම ඇතුළු පහත දැක්වෙන අංශ යටතේ ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලැබේ.

	සාමාජයීය සුභසාධන අංශය
	කාලසටහන් හා සමීක්ෂණ අංශය
	බස් ගාස්තු හා ධාවන මාර්ග සැලසුම් අංශය
	සංඛ්‍යාලේඛන අංශය
	ආයතනික නවීකරණ හා යටිතල පහසුකම් සංවර්ධන අංශය

2.01 සාමාජයීය සුභසාධනය අංශය

ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව පැවරී ඇති පාසල් ළමයින් සඳහා සහ විශ්ව විද්‍යාලවල, කාර්මික ආයතන වල සහ ඒ හා සමාන වෙනත් ආයතන වල ශිෂ්‍යයන් සඳහා අනුග්‍රාහක ගාස්තු මත පාසල් සේවා සැලැස්වීම යන කර්තව්‍ය අනුව "සිසුසැරිය" බස් සේවාව ද ලාභ නොලබන මාර්ගවල බස්රථ සේවා සැලසෙන බවට වගබලා ගැනීම සහ අවශ්‍ය විටක, එවැනි සේවා සලසන තැනැත්තන්ට මූල්‍යාධාර සැලසීම සහතික කිරීම යන කර්තව්‍ය අනුව "ගැමි සැරිය" සහ "නිසි සැරිය" යන බස් සේවාවන්ද සමාජයීය සුභසාධනය ප්‍රමුඛ කොටගත් බස්රථ සේවා වශයෙන් ක්‍රියාත්මක වේ.

- **පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය - "සිසු සැරිය"**

සහන ගාස්තු ක්‍රමයක් යටතේ ක්‍රියාත්මක කෙරෙන මෙම "සිසු සැරිය" පාසල් බස්රථ ව්‍යාපෘතිය, පාසල් දරුවන්ටම වෙන්වූ වඩාත් විශ්වසනීය, ආරක්ෂාකාරී ප්‍රවාහන සේවාවක් පාසල් දරුවන් සඳහා සැපයීම අරමුණු කොට 2005 වර්ෂයේදී ආරම්භ කර ඇත. ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ මෙම ව්‍යාපෘතිය යටතේ ධාවනය කරන අතර මෙම බස්රථ වලින් ගමන්ගන්නා පාසල් දරුවන්ගේ පූර්ණ ආරක්ෂාව තකා කොන්දේසි මාලාවකට යටත් කොට ඇත.

මෙම කොන්දේසි පෞද්ගලික බස්රථ ධාවකයන් හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අදාල කොන්දේසි මාලාවන් පහත දැක්වේ.

සිසුසැරිය(පෞද්ගලික බස්රථ) - පාසල් බස් සේවාවේ කොන්දේසි මාලාව -

1. බස්රථ වල රැගෙන යා හැක්කේ පාසල් නිල ඇඳුමින් සැරසුනු දරුවන් පමණි. (ගුරුවරුන්ටද ගමන් කළ හැකිය)
2. ළමයින්ගෙන් නියමිත ගමන් ගාස්තුවෙන් අඩක් පමණක් අය කළ යුතුය.
   - අවුරුදු 12 ට වැඩි ළමුන්ගෙන් සම්පූර්ණ ගමන් ගාස්තුවෙන් 50%කි.
   - අවුරුදු 12 ට අඩු ළමුන්ගෙන් සම්පූර්ණ ගමන් ගාස්තුවෙන් 25%කි.
   - ගුරුවරුන්ගෙන් නියමිත සාමාන්‍ය ගමන් ගාස්තුව
3. නව සේවා සඳහා ගිවිසුම්ගත වීමේදී බස්රථයේ ආයු කාලය නිෂ්පාදන වර්ෂයේ සිට වර්ෂ 15 නොඉක්මවිය යුතුය. වර්ෂ 15 ඉක්මවා ඇත්නම් වසර 15 – 20 අතර බස්රථයක් නම් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක මෝටර්රථ කොමසාරිස් විසින් පරීක්ෂා කර සහතික කළ යෝග්‍යතා සහතිකය ඉදිරිපත් කළ යුතුය. වසර 20 ඉක්මවා ඇති බස්රථ සිසුසැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගනු නොලැබේ.
4. සිසුසැරිය සේවාව සැපයීම සඳහා ස්ථිර බස්රථයක් තිබිය යුතුය. නියමිත බස්රථය ධාවනයේ යෙදවීමට නොහැකි වූ අවස්ථා වලදී අතිරේක බස්රථයක් කඩිනමින් යොදවා ශිෂ්‍යයින් අවශ්‍ය පාසල් දක්වා ප්‍රවාහනය කළ යුතුය. ඒ බව ජාතික ගමනාගමන කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.
5. නියමිත කාල සටහන අනුව දිනපතා පාසල පටන් ගැනීමට විනාඩි 15කට පෙර පාසල වෙත ළඟා වීමටත්, පාසල අවසන් කිරීමට පෙර නැවත ළමයින් රැගෙන යාම සඳහා පාසල වෙත පැමිණිමටත් කටයුතු කළ යුතුය. (බස්රථයට සියලුම සිසු දරුවන් ගොඩ වූ පසු සවස ගමන් වාරය ධාවනය ආරම්භ කරන්න. ආසන්න වශයෙන් ප.ව. 1.45 පමණ වන තෙක් බස්රථය පාසල අසල රඳවා තබන්න)
6. පාසල අසලටම බස්රථය ධාවනය කළ යුතුය.
7. බස්රථය ධාවනය වන අවස්ථා වල බස්රථයේ පිටුපස දොර වසා තිබිය යුතුය.
8. බස්රථයේ සිසුසැරිය ස්ටිකරයේ ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රදර්ශනය කළ යුතුය.
9. ගාස්තු සටහන බස්රථයේ ප්‍ර ප්‍රදර්ශනය කළ යුතුය.
10. ගමනාන්තය සහ මාර්ග අංකය පැහැදිලිව ප්‍ර ප්‍රදර්ශනය කළ යුතුය.
11. බස්රථයේ රූපවාහිනී යන්ත්‍ර, තිරරෙදි, අඳුරු කළ වීදුරු නොතිබිය යුතුය.
12. ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම අනිවාර්ය වේ.

13. **කොන්දොස්තරවරයෙකු අනිවාර්යයෙන් සේවයේ යෙදිය යුතුය.**
14. බස්රථයේ කාර්ය මණ්ඩලයේ (රියදුරු සහ කොන්දොස්තර) වයස් සීමාව වසර 30 හෝ 30 ඉක්මවිය යුතුය.
15. **මාසික ගාස්තු අය නොකළ යුතුය. (වැඩිපුර ගාස්තු අය නොකළ යුතුය)**
16. **පිටස්තර මගීන් රැගෙන නොයා යුතුය.**
17. සිසුසැරිය ලොග් පත්‍රය දෛනිකව සටහන් යොදා බස්රථයේ තබා ගත යුතුය.
18. සිසුසැරිය ලොග් පත්‍රය සහතික කිරීම සඳහා බස්රථයේ ස්ථිරව ගමන් කරන ගිවිසුම්ගත ගමනාන්ත පාසලේ ගුරුවරයෙකු සහ ළමයි දෙදෙනෙකු හෝ ගුරුවරයෙකු නොමැති නම් ළමයි තිදෙනෙකු නම් කර පත්කර ගත යුතුය.
19. සිසුසැරිය ලොග් පත්‍රය සම්පූර්ණ කිරීමේදී මකන දියර (ටිපෙක්ස්) භාවිතා කර හෝ සීරීම මගින් විකෘති නොකළ යුතුය.
20. සම්පූර්ණ කළ ලොග් පත්‍රිකා ඊළඟ මස 15 දිනට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.
21. ගමනාන්ත පාසල දක්වා බස්රථය ධාවනය වුවද එම මාර්ගයේ පවතින අනෙකුත් පාසල් වල සිසු දරුවන් රැගෙන යා යුතු අතර ගමනාන්ත පාසලට යටින් **"පොදු පාසල්"** පුවරුවක් බස්රථයේ ප්‍රදර්ශනය කළ යුතුය. තවද අනාරක්ෂිත අන්දමින් සිසු දරුවන් ප්‍රවාහනය නොකළ යුතුය (Over Loading)
22. සහනාධාර හිමිකම් ලැබීම සඳහා අවම වශයෙන් 90% ක ධාවන මට්ටමක් පවත්වාගෙන යා යුතුය.
23. ජංගම පරීක්ෂණ නිලධාරීන්ගේ පරීක්ෂණ කටයුතු වලදී ඊට සහයෝගය දැක්විය යුතුය.

සිසුසැරිය (ශ්‍රී ලංගම බස්රථ) - පාසල් බස් සේවාවේ කොන්දේසි මාලාව

1. බස්රථ වල රැගෙන යා හැක්කේ පාසල් නිල ඇඳුමින් සැරසුනු දරුවන් පමණි. (ගුරුවරුන්ටද ගමන් කළ හැකිය)
2. ළමයින්ගෙන් නියමිත ගමන් ගාස්තුවෙන් අඩක් පමණක් අය කළ යුතුය.
3. අවුරුදු 12 ට වැඩි ළමුන්ගෙන් සම්පූර්ණ ගමන් ගාස්තුවෙන් 50%කි.
4. අවුරුදු 12 ට අඩු ළමුන්ගෙන් සම්පූර්ණ ගමන් ගාස්තුවෙන් 25%කි.
5. ගුරුවරුන්ගෙන් නියමිත සාමාන්‍ය ගමන් ගාස්තුව
6. ශ්‍රී ලංගම බස්රථ සඳහා වාර ප්‍රවේශ පත්‍රය වලංගු වේ.
7. නව සේවා සඳහා ගිවිසුම්ගත වීමේදී බස්රථයේ ආයු කාලය නිෂ්පාදන වර්ෂයේ සිට වර්ෂ 15 නොඉක්මවිය යුතුය. වර්ෂ 15 ඉක්මවා ඇත්නම් වසර 15 – 20 අතර බස්රථයක් නම් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක මෝටර්රථ කොමසාරිස් විසින් පරීක්ෂා කර සහතික කළ යෝග්‍යතා සහතිකය ඉදිරිපත් කළ යුතුය. වසර 20 ඉක්මවා ඇති බස්රථ සිසුසැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගනු නොලැබේ.
8. සිසුසැරිය සේවාව සැපයීම සඳහා ස්ථිර බස්රථයක් තිබිය යුතුය. නියමිත බස්රථය ධාවනයේ යෙදවීමට නොහැකි වූ අවස්ථා වලදී අතිරේක බස්රථයක් කඩිනමින් යොදවා ශිෂ්‍යයින් අදාල පාසල් දක්වා ප්‍රවාහනය කළ යුතුය. එසේ වෙනත් බස්රථයක් ධාවනය වූයේනම් ලොග් පත්‍රයේ සටහන් තීරුවේ බස්රථ අංකය සටහන් කළ යුතුය.
9. නියමිත කාල සටහන අනුව දිනපතා පාසල පටන් ගැනීමට විනාඩි 15කට පෙර පාසල වෙත ළඟා වීමටත්, පාසල අවසන් කිරීමට පෙර නැවත ළමයින් රැගෙන යාම සඳහා පාසල වෙත පැමිණිමටත් කටයුතු කළ යුතුය. (බස්රථයට සියලුම සිසු දරුවන් ගොඩ වූ පසු සවස ගමන් වාරය ධාවනය ආරම්භ කරන්න. ආසන්න වශයෙන් ප.ව. 1.45 පමණ වන තෙක් බස්රථය පාසල අසල රඳවා තබන්න)
10. පාසල අසලටම බස්රථය ධාවනය කළ යුතුය.
11. බස්රථය ධාවනය වන අවස්ථා වල බස්රථයේ පිටුපස දොර වසා තිබිය යුතුය.
12. බස්රථයේ සිසුසැරිය ස්ටිකරයේ ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රදර්ශනය කළ යුතුය.
13. ගාස්තු සටහන බස්රථයේ ප්‍රදර්ශනය කළ යුතුය.
14. ගමනාන්තය සහ මාර්ග අංකය පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතුය.

15. බස්රථයේ රූපවාහිනී යන්ත්‍ර, තිරරෙදි, අඳුරු කළ වීදුරු නොතිබිය යුතුය.
16. ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම අනිවාර්ය වේ.
17. කොන්දොස්තරවරයෙකු අනිවාර්යයෙන් සේවයේ යෙදිය යුතුය.
18. බස්රථයේ කාර්ය මණ්ඩලයේ (රියදුරු සහ කොන්දොස්තර) වයස් සීමාව වසර 30 හෝ 30 ඉක්ම විය යුතුය.
19. පිටස්තර මගීන් රැගෙන නොයා යුතුය.
20. සිසුසැරිය ලොග් පත්‍රය දෙනිකව සටහන් යොදා බස්රථයේ තබා ගත යුතුය.
21. සිසුසැරිය ලොග් පත්‍රය සහතික කිරීම සඳහා බස්රථයේ ස්ථිරව ගමන් කරන ගිවිසුම්ගත ගමනාන්ත පාසලේ ගුරුවරයෙකු සහ ළමයි දෙදෙනෙකු හෝ ගුරුවරයෙකු නොමැති නම් ළමයි තිදෙනෙකු නම් කර පත්කර ගත යුතුය.
22. සිසුසැරිය ලොග් පත්‍රය සම්පූර්ණ කිරීමේදී මකන දියර (ටිපෙක්ස්) භාවිතා කර හෝ සීරීම මගින් විකෘති නොකළ යුතුය.
23. සම්පූර්ණ කළ ලොග් පත්‍රිකා ඊළඟ මස 15 දිනට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.
24. ගමනාන්ත පාසල දක්වා බස්රථය ධාවනය වුවද එම මාර්ගයේ පවතින අනෙකුත් පාසල් වල සිසු දරුවන් රැගෙන යා යුතු අතර ගමනාන්ත පාසලට යටින් ‘‘පොදු පාසල්’’ පුවරුවක් බස්රථයේ ප්‍රදර්ශනය කළ යුතුය. තවද අනාරක්ෂිත අන්දමින් සිසු දරුවන් ප්‍රවාහනය නොකළ යුතුය (Over Loading)
25. සහනාධාර හිමිකම් ලැබීම සඳහා අවම වශයෙන් 90% ක ධාවන මට්ටමක් පවත්වාගෙන යා යුතුය.
26. ජංගම පරීක්ෂණ නිලධාරීන්ගේ පරීක්ෂණ කටයුතු වලදී ඊට සහයෝගය දැක්විය යුතුය.





මෙම බස්රථ වලින් ගමන්ගන්නා පාසල් දරුවන්ගෙන් සාමාන්‍ය බස්ගාස්තුවෙන් අඩක් පමණක් අයකිරීම විශේෂත්වයකි. එමගින් ධාවකයාට වන මූල්‍යමය හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා පාසල් දරුවන් රැගෙන ධාවනය වන කි.මී. 01කට සහනාධාරයක් වශයෙන් දිනකට උපරිම කි.මී. 110 දක්වා (උදේ හවස ගමන්වාර දෙක ආවරණය වන පරිදි) රජය විසින් ගෙවීම් කරනු ලැබේ.

භෞතික ප්‍රගතිය


ඉන්ධන මිල සීඝ්‍රයෙන් ඉහලයාම අනුව පෞද්ගලික පාසල් වෑන් රථ හා බස් රථවල අයකරන ගාස්තුද ඉතා විශාල වශයෙන් ඉහළ යාම හේතුකොට ගෙන, දෙමාපියන් විසින් මෙන්ම පාසල් වල විදුහල්පතිවරුන් විසින්ද සිසු සැරිය ව්‍යාපෘතිය යටතේ බස්රථ යොදවන ලෙස ඉල්ලීම් රැසක් දිනපතා ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී.

මෙම දිනපතා වැඩිවන ඉල්ලීම් සැලකිල්ලට ගෙන

2023 වර්ෂය සඳහා 2023.12.31 දින වන විට නව සේවා ශ්‍රී ලංගම මගින් 122ක්ද පුද්ගලික අංශය මගින් 38ක්ද වශයෙන් 160ක් ආරම්භ කරන ලද අතර සේවා දීර්ඝ කිරීම් 9ක් සිදුකරන ලදී. ඒ අනුව 2023.12.31 වන විට ක්‍රියාත්මකව පැවති මුළු සිසු සැරිය සේවා සංඛ්‍යාව 1500කි. ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 68ක් වේ

2023 වර්ෂය තුළ පමණක් ආරම්භ කරන ලද 'සිසු සැරිය' නව බස් සේවා පළාත් අනුව පහත වගුවෙහි දැක්වේ.

අනු අංකය	පළාත	2023 ආරම්භ කරන ලද නව සේවා	
		පුද්ගලික බස් සේවා	ශ්‍රී ලංගම බස් සේවා
01	බස්නාහිර	3	9
02	දකුණ		18
03	වයඹ	6	14
04	උතුරු මැද	4	13
05	සබරගමුව	2	8
06	ඌව	3	41
07	නැගෙනහිර	5	5
08	මධ්‍යම	6	10
09	උතුර		4
10	අන්තර්පළාත්	9	
	එකතුව	**38**	**122**



2023.12.31 වන විට ක්‍රියාත්මක සියළුම 'සිසු සැරිය' බස් සේවා ගණන පළාත් අනුව පහත වගුවෙහි දැක්වේ.

අනු අංකය	පළාත	'සිසු සැරිය' මුළු බස්සේවා
01	බස්නාහිර	340
02	දකුණ	91
03	වයඹ	306
04	උතුරු මැද	200
05	සබරගමුව	93
06	ඌව	178
07	නැගෙනහිර	154
08	මධ්‍යම	77
09	උතුර	31
10	අන්තර්පළාත්	30
	එකතුව	**1500**

- **ග්‍රාමීය බස්රථ සේවා ව්‍යාපෘතිය -"ගැමිසැරිය"**

කිසිදු බස්රථ සේවාවක් ක්‍රියාත්මක නොවන, සමාජයීය වශයෙන් බස්රථ සේවාවක් අවශ්‍ය වුවද ලාභ නොලබන මාර්ග බැවින් මගී ප්‍රවාහනය සඳහා ධාවකයින් ඉදිරිපත් නොවන ග්‍රාමීය ප්‍රදේශ වල වෙසෙන ජනතාවට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2005 වර්ෂයේදී "ගැමිසැරිය" ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.



ගැමිසැරිය බස්රථ සේවාව සඳහා ධාවකයින් තෝරාගැනීම විවෘත ටෙන්ඩර් පරිපාටියක් යටතේ සිදුකරන අතර එහිදී කිලෝමීටර් එකක් සඳහා අඩුම ලංසුවක් ඉදිරිපත් කරන ධාවකයා තෝරාගනී. එසේ තෝරාගන්නා ධාවකයාට අදාළ ප්‍රවාහන අධිකාරිය මගින් ග්‍රාමීය මාර්ගයන්හි මගී ප්‍රවාහනයට මගීසේවා අවසරපත්‍රයක් නිකුත් කරන අතර, එම මගීසේවා අවසර පත්‍රය සහ පළාත් ප්‍රවාහන අධිකාරියේ නිර්දේශය මත ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අදාළ බස්රථහිමියා ගැමිසැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගිවිසුම් අත්සන් කරනු ලැබේ.

මෙම ගිවිසුම අනුව එකඟවන සහනාධාර මුදල උපරිම වසර තුනක් සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබේ. වසර තුනකින් පසු එම මාර්ගය ආර්ථික වශයෙන් ඵලදායී මාර්ගයක් වූ පසු සහනාධාර ගෙවීම් අත්හිටුවනු ලැබේ. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද ගැමිසැරිය සේවා රැසක් මේ වන විට ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ග්‍රාමීය ජනතාවට සේවා සපයමින් ක්‍රියාත්මක වේ.

භෞතික ප්‍රගතිය

2023 වර්ෂය සඳහා නව ගැමි සැරිය සේවා 2ක් ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් ධාවකයින් දෙදෙනෙකු තෝරා ගන්නා ලදී.

ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 40ක් වේ.

- **රාත්‍රී බස් සේවා ව්‍යාපෘතිය - "නිසිසැරිය"**

රාත්‍රී කාලයේ හා අළුයම කාලයේ පොදු ප්‍රවාහන බස්රථ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම දිරිමත් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2005 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. මෙමගින් රාත්‍රී කාලයේ හා අළුයම පොදු ප්‍රවාහන බස්රථ අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම නිසා මහජනතාව පත්වන දුෂ්කරතා අවම කර ඔවුන්ට ස්ථීර පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් සැපයීමත්, මහජනයාට වෙනත් ප්‍රවාහන මාධ්‍ය (ත්‍රී රෝද රථ, කුලී රථ) සපයා ගැනීම සඳහා වැය කිරීමට සිදුවන අධික පිරිවැය සහ වැයවන කාලය අවම කිරීමත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ රාත්‍රී අවසන් ගමන් වාරයට සහ අළුයම පළමු ගමන්වාරයට සහනාධාර වශයෙන් කිලෝමීටර එකකට මුදලක් රජය විසින් ගෙවීම් කරන අතර මහජනතාවගෙන් නියමිත බස්ගාස්තුව අයකරනු ලැබේ.



භෞතික ප්‍රගතිය

2023 වර්ෂය සඳහා නව නිසි සැරිය සේවා 60ක් ආරම්භ කරන ලද අතර 2023.12.31 වන විට ක්‍රියාත්මකව පැවති මුළු නිසි සැරිය සේවා සංඛ්‍යාව 276කි.

ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 60ක් වේ.

ඒ අනුව 2023.12.31 දිනට ක්‍රියාත්මකව පවතින වලංගු නිසි සැරිය රාත්‍රී බස්රථ සේවා පළාත් අනුව පහත පරිදි වේ.

අනු අංකය	පළාත	2023 වර්ෂයේ ආරම්භ කරන ලද නව සේවා	මුළු 'නිසි සැරිය' බස්සේවා
01	බස්නාහිර	12	76
02	දකුණ	10	53
03	වයඹ	9	30
04	උතුරු මැද	2	8
05	සබරගමුව	4	18
06	ඌව	1	12
07	නැගෙනහිර	0	1
08	මධ්‍යම	22	73
09	උතුර		5
	එකතුව	**60**	**276**

මූල්‍ය ප්‍රගතිය - "සිසු සැරිය", "ගැමි සැරිය" සහ "නිසි සැරිය " ව්‍යාපෘති

2023 වර්ෂය ආරම්භයේදී පැවති සිසු සැරිය හා නිසිසැරිය සේවා සඳහා සහනාධාර ගෙවමින් පවත්වාගෙන යාම සහ 2023 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නව සේවා සඳහා සහනාධාර ගෙවීම් කිරීමට ජාතික අයවැයෙන් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 2000 කි.

නමුත් 2023 වර්ෂය සඳහා රුපියල් මිලියන 1,580.0ක් මහා භාණ්ඩාගාරයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලබාදී ඇති අතර එම රුපියල් මිලියන 1,580.0, 2023.12.31 දින වන විට සහනාධාර වශයෙන් ගෙවා ඇත.
ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 93ක් වේ.

2.2 කාලසටහන් හා සමීක්ෂණ අංශය




2.2.1 ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ

මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස, පිළිගත හැකි තත්ත්වයකින් යුත් බස්රථ සේවා පවතින්නේද යන වග අවලෝකනය කිරීම සහ එම සේවා පවත්වාගෙන යායුතු අවම මට්ටම තීරණය කිරීම; 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් දක්වා ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කර්තව්‍යයකි.
ඒ අනුව මහජනතාවගේ අවශ්‍යතාවය පරිදි විශ්වසනීය, ගුණාත්මක, සුවපහසු පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් ගෙවිය හැකි මිලකට සැපයීම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සහ එම දත්ත විශ්ලේෂණය කර තීරණ ගැනීම සඳහා අදාළ පාර්ශවයන් වෙත යොමු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.
කොවිඩ් වෛරස් වසංගතය, ඉන්ධන අර්බුදය වැනි හේතූන් නිසා ආර්ථිකයේ ඇතිවූ අර්බුදකාරී තත්ත්වය හේතු කොටගෙන 2020 සිට 2022 වර්ෂයේ අවසානය දක්වා මගීන්ගේ ගමනාගමන කටයුතු, ගමනාගමන රටාවන් බොහෝ දුරට වෙනස් විය. එම වෙනස්වීම් නිසා බස්රථ කර්මාන්තයද දැඩි අර්බුදයකට ලක් විය. ඒ අනුව උක්ත ගැටළු හේතුවෙන් සිදු වූ මගීන්ගේ ගමන් රටාවන්ගේ වෙනස්වීම් හඳුනාගෙන ඒ අනුව බස්රථ සේවා සැලසුම් කිරීම සිදුකරන ලෙස ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් පරිදි මුළු දිවයින පුරා ධාවනය වන සියළුම අන්තර් පළාත් බස්රථ සේවාවන් වල මගී ඉල්ලුම හඳුනාගැනීම හා ඒ අනුව ඒකාබද්ධ

කාලසටහන් සකස් කිරීම සඳහා මගී ඉල්ලුම් සමීක්ෂණ සිදු කරන ලදී. ඒ අනුව මගී ඉල්ලුම හා ආසන සැපයුම හඳුනා ගැනීමේ සමීක්ෂණ කොළඹ සිට අන්තර් පළාත් ධාවනය වන ප්‍රධාන පිවිසුම් මාර්ග සහ කොළඹ හරහා ධාවනය නොවන වෙනත් අන්තර් පළාත් මාර්ග ආවරණය වන පරිදි සිදු කරන ලදී. සාමාන්‍යයෙන් පහත ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සමීක්ෂණ සිදු කරනු ලබයි.

* මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා හඳුනාගැනීම සහ ඒ අනුව නව බස්රථ සේවා ආරම්භ කිරීම සඳහා ගෙන් ගෙට ගොස් සිදුකෙරෙන සමීක්ෂණ (House Hold Survey)
* පවතින බස්රථ සේවාවල ධාවන කාලසටහන් සකස්කිරීම හා සංශෝධනය කිරීම සඳහා සිදුකෙරෙන මගී ඉල්ලුම් සමීක්ෂණ (Passenger Demand Survey)
* පවතින බස්රථ සේවාවේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් මහජනතාවගේ තෘප්තිමත්භාවය තහවුරු කරගැනීම සහ ඒ අනුව මහජනතාවට බලාපොරොත්තුවන ගුණාත්මක බස්රථ සේවා සැපයීම සඳහා සිදුකෙරෙන මගීන්ගේ අදහස් විමසීමේ සමීක්ෂණ (Passenger Interview Survey)
* බස්රථවල ධාවන කාල නිර්ණය කිරීම සඳහා සිදුකෙරෙන ධාවන කාල සමීක්ෂණ (Travel Time Survey)


ජාතික ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරන ලද සමීක්ෂණයේ තොරතුරු පහත පරිදි වේ.




සමීකෂණ සිදු කළ ස්ථාන

අන්තර් පළාත් බස්රථ ධාවනය වන සියළුම මාර්ග ආවරණය වන පරිදි පහත දක්වා ඇති ස්ථාන 98 කදී මගීන් වැඩි කාර්යය බහුල දිනයක් (සිකුරාදා හෝ සඳුදා) හා එසේ නොවන සාමාන්‍ය මගීන් සිටින සතියේ දිනයක් (අගහරුවාදා හෝ බ්‍රහස්පතින්දා) ආවරණය වන පරිදි අඛණ්ඩව පැය 48 ක් තුල සමීක්ෂණ සිදු කර එම සමීක්ෂණ ස්ථාන 98 හරහා මාර්ගය දෙපසටම ධාවනය වූ සියළුම ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සහ එම ස්ථාන වලින් ආරම්භ වන බස්රථ සේවා පවතින විටදී එම බස්රථ පිටත්වීමේදී පරීක්ෂා කර පහත තොරතුරු රැස් කර ගන්නා ලදී.


- සමීක්ෂණය සිදු කළ ස්ථානයෙන් බස්රථය පිටත් වූ වේලාව හා එම අවස්ථාවේදී බස්රථයේ ගමන් ගත් මගීන් සංඛ්‍යාව
- බස්රථයේ ආසන සංඛ්‍යාව,
- බස්රථය ශ්‍රී ලංගමද පෞද්ගලික ද යන වග
- බස්රථය ධාවනය කළ මාර්ගය හා මාර්ග අංකය ගමනාරම්භය, ගමනාන්තය
- බස්රථයේ සේවාව (සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, සාමාන්‍ය, අධි සුඛෝපභොගී) යන වග
- සමීක්ෂණය සිදු කළ දිනය, ස්ථානය



මහනුවර පිවිසුම් මාර්ගය



පුත්තලම පිවිසුම් මාර්ගය




කුරුණෑගල පිවිසුම් මාර්ගය

Dambulla Corridor

Survey Points

1. Colombo(CBS & Bastian Mw Terminal)
2. Warakapola Mid Point
3. Kuruvegala Bus Stand & Mid Point
4. Dambulla Mid Point
5. Anuradapura Bus Stand
6. Habarana Mid Point
7. Trincomalee Bus Stand
8. Batticaloa Bus Stand
9. Kadaruwela Bus Stand
10. Kandy Bus Stand
11. Galagedara Mid Point




හයිලෙවල්, ලෝලෙවල් පිවිසුම් මාර්ගය හා සමගාමී මාර්ග


High Level & Low Level Road Corridor

Survey Points

1. Colombo(CBS & Bastian Mw Terminal)
2. Kaluaggala Mid Point
3. Hatton Bus Stand
4. Rathnapura Bus Stand
5. Pelmadulla Mid Point
6. Balangoda Bus Stand
7. Bandarawela Bus Stand
8. Badulla Bus Stand
9. Udawalawa Mid Point
10. Embilipitiya Bus Stand
11. Matara Bus Stand
12. Tangalle Bus Stand
13. Wellawaya Bus Stand
14. Monaragala Bus Stand
15. Ampara Bus Stand




වෙනත් අන්තර් පළාත් මාර්ග



අධිවේගී මාර්ග

- කොටටාව අන්තර් හුවමාරුව
- ගොඩගම අන්තර් හුවමාරුව
- පින්නදූව අන්තර් හුවමාරුව



සමීක්ෂණයේදී රැස් කරන ලද දත්ත සංඛ්‍යාව

අනු අංකය	පිවිසුම් මාර්ගය	තොරතුරු ලබාගත් බස්රථ ගණන	සමීක්ෂණ සිදු කළ ස්ථාන
01.	ගාලු පිවිසුම් මාර්ගය	3,443	07
02.	මහනුවර පිවිසුම් මාර්ගය	4,536	09
03	කුරුණෑගල පිවිසුම් මාර්ගය	7,403	13
04.	පුත්තලම පිවිසුම් මාර්ගය	5,000	13
05	හයිලෙවල් සහ ලෝලෙවල් පිවිසුම් මාර්ගය	6,927	16
06	වෙනත් අන්තර් පළාත් මාර්ග (මහියංගනය - කදුරුවෙල මාර්ගය සහ ඒ හා සම්බන්ධ වෙනත් අන්තර් පළාත් මාර්ග)	642	39
07	වෙනත් අන්තර් පළාත් මාර්ග කුරුණෑගල-කොළඹ/මීගමුව මාර්ග සහ සහ ඒ හා සම්බන්ධ වෙනත් අන්තර් පළාත් මාර්ග)	1,087	
08	වෙනත් අන්තර් පළාත් මාර්ග කෑගල්ල-කුරුණෑගල/මාතලේ මාර්ග සහ ඒ හා සම්බන්ධ වෙනත් අන්තර් පළාත් මාර්ග	1,645	
09	වෙනත් අන්තර් පළාත් මාර්ග කෑගල්ල-අවිස්සාවේල්ල-කෑගල්ල/මහනුවර මාර්ග සහ ඒ හා සම්බන්ධ වෙනත් අන්තර් පළාත් මාර්ග	2,382	
10	වෙනත් අන්තර් පළාත් මාර්ග බදුල්ල-මහනුවර මාර්ගය සහ ඒ හා සම්බන්ධ වෙනත් අන්තර් පළාත් මාර්ග	177	
11	වෙනත් අන්තර් පළාත් නුවරඑළිය -වැලිමඩ මාර්ගය සහ ඒ හා සම්බන්ධ වෙනත් අන්තර් පළාත් මාර්ග	698	
12	අධිවේගී මාර්ග	3,780	3
	දත්ත රැස්කරන ලද ගමන්වාර ගණන	**37,720**	**100**

මෙම සමීක්ෂණය මගින් රැස් කරගන්නා ලද මුළු දත්ත විශ්ලේෂණය අනුව අන්තර් පළාත් ධාවනය වන සාමාන්‍ය සේවා බස්රථයක සාමාන්‍ය මගී පැටවුම සියයට 60ක හා සුඛෝපභෝගී සේවා බස්රථ වල සාමාන්‍ය මගී පැටවුම සියයට 50-60 අතර පවතින බව හඳුනාගන්නා ලදී.

මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 24.0ක් වෙන් කළ අතර 2023.12.31 දින වන විට රුපියල් මිලියන 13.424ක් මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 55.9 ක් වේ.

2.2.2 ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම.

2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතින් සංශෝධිත 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව "විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත ඇත්ත වශයෙන් වූ මගී ඉල්ලීම් සපුරාලීම සඳහා රාජ්‍ය බස් සේවයක් හෝ පෞද්ගලික බස් සේවයක් ලබා දීම" අරමුණු කර ගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සහ පෞද්ගලික බස්රථ සඳහා පොදු කාලසටහන් සකස් කරනු ලැබේ.
මෙමගින් බස්රථ අතර පවතින අහිතකර තරඟය අවමකර එක් එක් පාර්ශවය වෙත නිශ්චිත වූ වෙළඳපොළ කොටස වෙන්කරදීම තුලින් හිතකර තරඟකාරීවයක් ඇතිකර මහජනතාවට විශ්වසනීය, ආරක්ෂිත, සුවපහසු බස්රථ සේවාවක් සැපයීමට අපේක්ෂා කෙරේ.

භෞතික ප්‍රගතිය

සියලුම අන්තර් පළාත් මාර්ග සමීක්ෂණය කර හඳුනාගන්නා ලද මගී ඉල්ලුම අනුව සියළුම මාර්ග වලට අදාල දළ ඒකාබද්ධ කාල සටහන් සකස් කිරීම 2023 වර්ෂයේ සිදු කළ අතර එම දළ කාල සටහන් සම්බන්ධයෙන් අදාල පාර්ශව සමග සාකච්ඡා කර ධාවකයින්ගේ අදහස් ලබා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලදී

මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 0.6 ක් වෙන් කළ අතර 2023.12.31 දිනට රුපියල් මිලියන 0.528ක් මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 88 ක් වේ.

2.3 බස් ගාස්තු හා ධාවන මාර්ග සැලසුම් අංශය

2002.06.12 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව 2002 වර්ෂයේ ජූලි මස සිට ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් වාර්ෂික බස් ගාස්තු නිර්ණය කිරීම සිදුකරනු ලැබේ. එම බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව වාර්ෂික බස් ගාස්තු ප්‍රතිශෝධනය සෑම වර්ෂයකම ජූලි මස 01 දින ප්‍රකාශයට පත් කළ යුතු අතර එසේම වර්ෂයේ ප්‍රථම මාස 9 තුළ ඩීසල් මිලෙහි සීඝ්‍ර වැඩිවීමක් සිදු වුවහොත් එම වැඩි වීම සමස්ථ කිලෝමීටර් එකක ධාවන පිරිවැය 4%කට අධික ප්‍රමාණයකින් වැඩිවීමට දායක වුවහොත් ඩීසල් මිල වැඩි වී එක් මසක් තුළ අතුරු ගාස්තු වැඩි වීමක් සිදු කළ යුතුය. මේ සඳහා සලකා බලනු ලබන පිරිවැය සංරචක 12කි. එම පිරිවැය සංරචක පහත පරිදි වේ.

i. ඉන්ධන පිරිවැය (ඩීසල්)
ii. සේවක පිරිවැය
iii. සර්විස් කිරීම හා ලිහිසි
iv. ටයර් සහ ටියුබ්
v. වායුසමීකරණ යන්ත්‍ර
vi. අළුත්වැඩියා

vii. දිනපතා පොදු කාර්යය පිරිවැය
viii. මාසික පොදු කාර්යය පිරිවැය
ix. වාර්ෂික පොදු කාර්යය පිරිවැය
x. බස්රථ ක්ෂය වීම
xi. බස්රථ වල ණය මුදල් ගෙවීම
xii. අවදානම් සඳහා ප්‍රතිපාදන

2012 වර්ෂයේ සිට මේ දක්වා බස් ගාස්තු සංශෝධන ප්‍රතිශතය දැක්වෙන වගුව පහත දැක්වේ.

බස් ගාස්තු සංශෝධනය - (2012 සිට 2023 දක්වා)

බස් ගාස්තු සංශෝධනය සිදුවූ දින සහ සංශෝධනය සිදු වූ ප්‍රතිශත																				
සංශෝධනය වූ දිනය	2012-02-14	2013-11-01	2015-02-01	2016-08-01	2017-07-01	2018-05-23	2018-09-21	2018-11-09	2018-12-27	2020-11-11	2022-01-05	2022-03-15	2022-04-19	2022-05-25	2022-07-01	2022-07-20	2022-08-05	2023-03-31	2023-07-01	2023-09-03
සංශෝධනයේ ස්වභාවය	වර්ෂික	වර්ෂික	වර්ෂික	වර්ෂික	වර්ෂික	වර්ෂික	අන්තර්වාර	අන්තර්වාර	අන්තර්වාර	විශේෂ	වර්ෂික	අන්තර්වාර	අන්තර්වාර	අන්තර්වාර	වර්ෂික	අන්තර්වාර	අන්තර්වාර	අන්තර්වාර	වර්ෂික	අන්තර්වාර
කි.මී. 01 සඳහා ගාස්තුව				රු. 95.12	රු. 101.09	රු. 107.73	රු. 112.04	රු. 109.89	රු. 105.27	කොවිඩ් බස් ගාස්තු සංශෝධනය	රු. 123.62	රු. 140.56	රු. 175.36	රු. 209.54	රු. 276.79	රු. 270.63	රු. 267.55	රු. 235.21	රු. 250.32	රු. 259.87
විශේෂ කරුණු						6.56% ක ගාස්තු වැඩිවීමක් සිදු කළ ලබු දුවිත් අමාත්‍යාංශවලින් උපදෙස් මත ප්‍රතිශතය සංශෝධනය වීය				කොවිඩ් බස් ගාස්තු සංශෝධනය		13.7% ක ගාස්තු වැඩිවීමක් සිදු කළ ලබු දුවිත් අමාත්‍යාංශයේ උපදෙස් මත ප්‍රතිශතය සංශෝධනය වීය	24.76% ක ගාස්තු වැඩිවීමක් සිදු කළ ලබු දුවිත් අමාත්‍යාංශයේ උපදෙස් මත ප්‍රතිශතය සංශෝධනය වීය		32.09% ක ගාස්තු වැඩිවීමක් සිදු කළ ලබු දුවිත් 2022-04-19 දින වැඩි කළ 10% අඩුකරන ලදී		1.14% ක ගාස්තු අඩුවීමක් සිදු කළ ලබු දුවිත් 2020-11-11 දින කොවිඩ් සම්බන්ධතා වැඩි කළ 20% න් 10%ක් අඩුකරන ලදී		6.52% ක ගාස්තු වැඩිවීමක් සිදු කළ ලබු දුවිත් වැඩිවීමින් පිලිකාකාර අඩුකළ ලබු කොවිඩ් 10% ට අදාල ගාස්තු සමීකරණ ලදී	
ප්‍රතිශතය / ගාස්තු අවස්ථාව	20%	7%	-8.20%	6%	6.28%	12.50%	4%	-2%	-4.20%	20%	17.44%	15%	35%	19.49%	22%	-2.23%	-11.14%	-12.09%	6.52%	4.01%
1	9.00	9.00	8.00	9.00	10.00	12.00	12.00	12.00	12.00	14.00	17.00	20.00	27.00	32.00	40.00	38.00	34.00	30.00	30.00	30.00
2	12.00	13.00	12.00	12.00	13.00	15.00	15.00	15.00	14.00	17.00	20.00	23.00	32.00	38.00	46.00	45.00	42.00	37.00	37.00	38.00
3	16.00	17.00	15.00	16.00	17.00	19.00	20.00	20.00	19.00	23.00	27.00	31.00	41.00	50.00	60.00	59.00	54.00	48.00	48.00	50.00
4	19.00	20.00	18.00	20.00	21.00	24.00	25.00	24.00	23.00	28.00	33.00	38.00	51.00	61.00	74.00	73.00	67.00	59.00	59.00	61.00
5	23.00	24.00	22.00	24.00	25.00	28.00	30.00	29.00	28.00	33.00	39.00	45.00	61.00	73.00	89.00	87.00	80.00	70.00	70.00	73.00
6	27.00	28.00	26.00	28.00	29.00	33.00	34.00	34.00	32.00	39.00	46.00	52.00	71.00	84.00	103.00	101.00	92.00	81.00	81.00	84.00
7	30.00	32.00	30.00	32.00	34.00	38.00	39.00	38.00	37.00	44.00	52.00	60.00	81.00	96.00	117.00	115.00	105.00	92.00	92.00	96.00
8	32.00	34.00	32.00	33.00	35.00	40.00	41.00	41.00	39.00	47.00	55.00	63.00	85.00	102.00	124.00	121.00	109.00	96.00	96.00	99.00
9	34.00	37.00	34.00	36.00	38.00	43.00	44.00	43.00	42.00	50.00	59.00	67.00	91.00	109.00	133.00	130.00	117.00	103.00	103.00	107.00
10	36.00	39.00	36.00	38.00	40.00	45.00	47.00	46.00	44.00	53.00	62.00	72.00	97.00	116.00	141.00	138.00	126.00	110.00	110.00	115.00
11	38.00	41.00	38.00	40.00	42.00	48.00	50.00	49.00	47.00	56.00	66.00	76.00	103.00	123.00	150.00	147.00	134.00	118.00	118.00	122.00
12	41.00	44.00	40.00	43.00	45.00	51.00	53.00	52.00	50.00	60.00	70.00	81.00	109.00	130.00	159.00	155.00	140.00	123.00	123.00	128.00
13	43.00	46.00	42.00	45.00	48.00	54.00	56.00	55.00	52.00	63.00	74.00	85.00	115.00	137.00	167.00	164.00	149.00	131.00	131.00	136.00
14	45.00	48.00	44.00	47.00	50.00	57.00	59.00	58.00	55.00	66.00	78.00	90.00	121.00	144.00	176.00	172.00	157.00	138.00	138.00	143.00
15	48.00	51.00	47.00	50.00	53.00	59.00	62.00	61.00	58.00	70.00	82.00	94.00	127.00	152.00	185.00	181.00	163.00	143.00	143.00	149.00
16	49.00	53.00	49.00	52.00	55.00	62.00	64.00	63.00	60.00	72.00	85.00	97.00	132.00	157.00	192.00	188.00	169.00	149.00	149.00	155.00
17	52.00	56.00	52.00	54.00	57.00	64.00	67.00	66.00	63.00	75.00	88.00	102.00	137.00	164.00	200.00	196.00	178.00	156.00	156.00	163.00
18	53.00	57.00	53.00	56.00	60.00	67.00	70.00	68.00	65.00	78.00	92.00	106.00	143.00	171.00	208.00	204.00	184.00	162.00	162.00	168.00
19	55.00	59.00	55.00	58.00	62.00	70.00	72.00	71.00	68.00	82.00	96.00	110.00	149.00	178.00	217.00	212.00	193.00	169.00	169.00	176.00
20	58.00	62.00	57.00	60.00	64.00	72.00	75.00	74.00	71.00	85.00	99.00	114.00	154.00	185.00	225.00	220.00	199.00	175.00	175.00	182.00

2002 වර්ෂයේ සකස් කර ඇති මෙම ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම 2023 වර්ෂයේ සිදු කරමින් පැවති අතර ඒ අනුව සිදු කළයුතු සමීක්ෂණ 108ක් සිදු කර අවසන් කරන ලදී. වාර්ෂික බස් ගාස්තු සංශෝධනය ජූලි 1 වැනි දින ගැලපීම් සිදු කරනලද අතර නව බස් ගාස්තු ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව වර්ෂය තුළ රැස්වී 2024 පෙබරවාරි 28 වන දිනට ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය සකස්කර අවසන් කිරීමට තීරණය කරන ලදී.

ඉන්ධන මිල සංශෝධනයට අනුව අවස්ථා දෙකකදී අන්තර්වාර බස් ගාස්තු සංශෝධන සිදු කරන ලදී. එනම් පිළිවෙලින් 2023 මාර්තු 31 සහ සැප්තැම්බර් 03 දින බස් ගාස්තු සංශෝධන සිදුකර ප්‍රකාශයට පත් කරන ලදී.

මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 0.10ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.062 ක් 2023.12.31 දින වන විට වියදම් කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 62.0 ක් වේ.

2.4 සංඛ්‍යාලේඛන අංශය

2.4.1 ජාතික ප්‍රවාහන සංඛාලේඛන වාර්තාව සකස් කිරීම

“ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන” වාර්තාව 2010 වර්ෂයේ සිට වසරින් වසර වැඩි දියුණු කළ අනුවාදයක් ලෙස ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.



ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංඛ්‍යාලේඛන නිශ්චිත ස්ථානයක ගොනුකර නොමැතිවීමෙන් අනාදිමත් කාලයක සිට එම ක්ෂේත්‍රය තුළ පැවැති රික්තකයක් සපුරාලීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන්

සභාව විසින් දරන ලද ප්‍රයත්නයක සාර්ථක ප්‍රතිඵලයකි. මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, මාර්ග සංවර්ධන අධිකාරිය, මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සිවිල් ගුවන් සේවා අධිකාරිය සහ වරලත් ප්‍රවාහන හා ක්‍රමකාර්ය සම්පාදන ආයතනය යනාදී වගකිවයුතු රාජ්‍ය ආයතනවලින් අවශ්‍ය දත්ත සපයාගනු ලැබේ. මෙම වාර්තාවේ මූලික පරමාර්ථය වන්නේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ප්‍රවාහනය පිළිබඳ තාර්කික සහ දැනුවත් තීරණ ගැනීමට සහ පුරෝකථනය කිරීමට කටයුතු කරන පාර්ශවකරුවන්, පර්යේෂකයින්, සැලසුම්කරුවන් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඒ සඳහා අවශ්‍ය දත්ත එක් මූලාශ්‍රයකින් ලබා ගැනීමට අවකාශ සැලසීමයි. තවද ප්‍රවාහන විෂය සම්බන්ධව හදාරන විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට මෙන්ම පාසල් ශිෂ්‍යයන්ටද මෙය තම අධ්‍යාපනික කටයුතු සඳහා අවශ්‍ය දත්ත ලබාගත හැකි අධ්‍යාපනික වාර්තාවකි. මෙම වාර්තාව මහජනතාවගේ පරිශීලනය සඳහා සියළුම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, සියළුම විශ්ව විද්‍යාල සහ දිවයිනේ බෙහෝ පාසල් සහ මහජන පුස්තකාල වෙත නොමිළයේ බෙදා හරිනු ලැබේ. නවීන තාක්ෂණික ප්‍රවණතා සමඟ අනුගතවෙමින් මෙම වාර්තාවේ මෑත වර්ෂවල ඩිජිටල් පිටපත www. ntc.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කරගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

භෞතික ප්‍රගතිය

ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාවේ 2023 වර්ෂයට අදාළ වාර්තාව සකස්කර අන්තර්ජාලය හරහා එළිදැක්වීමට 2023 වර්ෂයේදී සැලසුම් කරන ලදී.
ඒ අනුව ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන 2023 වාර්තාව සම්පූර්ණ කර ntc.gov.lk වෙබ් අඩවිය හරහා 2023 දෙසැම්බර් මස 31 දින එළිදක්වන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 100 ක් වේ.

මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 3.102 ක් වෙන් කරන ලදී. 2023.12.31 දින වන විට රුපියල් මිලියන 0.081ක් පමණක් එනම් වෙන්කළ මුදලින් සියයට 2.61ක් වැය කරන ලදී.

2.4.2 පෞද්ගලික අංශයේ බස්රථ ධාවනය පිළිබඳ සංඛ්‍යාලේඛන සකස් කිරීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින්, දිවයින පුරා ක්‍රියාත්මක සියළුම අන්තර් පළාත් පෞද්ගලික පොදු මගී බස්රථ සේවා පිළිබඳව හා සියළුම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී මගින් ක්‍රියාත්මක කරනු ලබන පෞද්ගලික අංශයේ පොදු මගී බස්රථ සේවා පිළිබඳ බස්රථ ඇණිය, ධාවනය වූ බස් රථ සංඛ්‍යාව, ධාවනය වූ කිලෝමීටර ගණන ආදී මාසිකව ලබාගන්නා දත්ත එක්රැස් කර විශ්ලේෂණය කරනු ලැබේ. එම දත්ත විශ්ලේෂණය කර ලබාගන්නා තොරතුරු අනුසාරයෙන්

ත්‍රෛමාසිකව සකස්කරනු ලබන වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරනු ලබන අතර එම තොරතුරු වාර්ෂිකවද විශ්ලේෂණය කර ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

Private and Omni Bus Service

Item	2022 Jan - March	2023 Jan - March
Passenger Kilometers (Mn. Km)	7589.28	9053.3
Operated Kilometers (Mn Km)	152.71	180.8
No. of Buses Operated	10,720	12,490
Seating Capacity	469,032	549,168
Total Bus Fleet	20,104	20,069
Total Revenue	-	-

Table 2.10

Selected Public Transport Indicators by Provinces

Item	Western	Central	Southern	Northern	Eastern	North - Western	North - Central	Uva	Sabaragamuwa	Inter provincial NTC	All Island
Private Bus Service											
Private Operator Buses											
2021	6,082	2,452	1,335	1,003	658	1,426	701	1,283	1,974	3,107	20,021
2022	5890	2457	1335	999	659	1426	681	1306	1980	3315	19862
2023	6088	2473	1341	999	663	1413	691	1314	1962	3152	20096
Buses Operated											
2021	2,621	1,227	478	503	238	589	291	567	1,017	1,522	9,053
2022	2603	1543	630	488	368	404	600	549	1173	1449	9807
2023	3286	1716	1257	426	417	876	663	940	1281	2002	12864
Seating Capacity											
2021	110,082	51,534	20,076	21,126	9,996	24,738	12,222	23,814	42,714	82,188	398,490
2022	109326	109326	64806	26460	20496	15456	16968	25200	23058	49266	78246
2023	138012	138012	72072	52794	17892	17514	36792	27846	39480	53802	108108
Operated Kilometers, Mn											
2021	97.67	45.72	17.81	18.74	8.87	21.95	10.84	21.13	37.9	83.43	364.06
2022	97.00	57.50	23.48	18.18	13.71	15.05	22.36	20.46	43.71	113.95	425.40
2023	122.45	63.95	46.84	15.87	15.54	32.64	24.71	35.03	47.73	157.43	474.09
Passenger Kilometers, Mn											
2021	4102.09	1920.36	748.11	787.24	372.49	921.84	455.44	887.4	1591.69	4,505.30	16291.96
2022	4073.92	2414.93	986.01	763.76	575.95	632.3	939.05	859.23	1835.85	6153.11	19234.11
2023	5657.17	2954.26	2164.05	733.40	717.91	1508.12	1141.42	1618.3	2205.36	9551.54	28051.52

මීට අමතරව ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙතද ත්‍රෛමාසිකව හා වාර්ෂිකව දිවයින පුරා අන්තර් පළාත් හා ඒ ඒ පළාත් තුළ ක්‍රියාත්මක කරනු ලබන පෞද්ගලික අංශයේ පොදු මගී බස් සේවා පිළිබඳ විශ්ලේෂිත තොරතුරු වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

වගුව 7.8 : පොදු බස්රථ සේවාවන් පිළිබඳ සංඛ්‍යාන

අයිතමය	පුද්ගලික බස්රථ
මාර්ග සංඛ්‍යාව	4118
ධාවනය කළ දුර (කි.මී. මිලියන) - වර්ෂයටම	425.4
බලපත්‍ර ලැබූ බස්රථ සංඛ්‍යාව	19,862
දිනකට ධාවනය කළ බස්රථ සංඛ්‍යාව	9,807
ගෙනගිය මගීන් සංඛ්‍යාව (මිලියන) - වර්ෂයටම	1,125
මගියකු ගමන්කළ සාමාන්‍ය දුර ප්‍රමාණය (කි.මී.) - දිනකට	18
මුළු ආදායම	-
බස් කි.මී.ට ලද ආදායම	-

2.5 ආයතනික නවීකරණ හා යටිතල පහසුකම් සංවර්ධන අංශය

2.5.1 ආයතනික ගොඩනැගිලි නවීකරණ

ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ, මෙම ව්‍යාපෘතිය මගින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අයත් ගොඩනැගිලි නවීකරණය හා නඩත්තුවත් බස් පර්යන්ත යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුවත් සිදු කරනු ලැබේ. ඒ යටතේ පහත දැක්වෙන කාර්යයන් 2023 වර්ෂයේ ඉටු කිරීමට සැලසුම් කරන ලදී.

- ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අයත් ගොඩනැගිලි නවීකරණය
- ආයතනයේ පරිභෝජනය සඳහා අවශ්‍ය විදුලිබලය විකල්ප ක්‍රමවේදයක් මගින් උත්පාදනය කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභා ගොඩනැගිල්ලෙහි වහලය මත සූර්ය පැනල සවි කිරීම
- බැස්ටියන් මාවත හා වව්නියාව බස් පර්යන්තවල ප්‍රතිසංස්කරණ

භෞතික ප්‍රගතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ආරක්ෂක කුටීරය සහ මායිම් තාප්පය ප්‍රතිසංස්කරණය සඳහා අදාල ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර 2023 නොවැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.
මෙම ඉදිකිරීම් සඳහා අවශ්‍ය භාණ්ඩාගාර අනුමැතිය ලැබීමට නියමිතව ඇති අතර ඒ අනුව අදාල ප්‍රතිසංස්කරණ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතය.
ජාතික ගමනාගමන කොමිෂන් සභා ගොඩනැගිල්ලෙහි වහලය මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය සහ ගොඩනැගිලි අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

වවිනියාව බස් පර්යන්තයේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පළමු ලංසු කැඳවීමේදී එක් අයෙකු පමණක් ඉදිරිපත් වූ බැවින් පුවත්පත් දැන්වීමක් හරහා විවෘත ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ අතර 2 වන ලංසු විවෘත කිරීම 2023 දෙසැම්බර් 29 වන දින සිදු කරන ලදී.

බැස්ටියන් මාවත බස් පර්යන්තයේ ඉදි කිරීමට සැලසුම් කර ඇති නව වේදිකාව ඉදිකිරීම සඳහා අවශ්‍ය භාණ්ඩාගාර අනුමැතිය ලැබීමට නියමිතව ඇත.

මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ

- ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අයත් ගොඩනැගිලි නවීකරණය සඳහා රුපියල් මිලියන 10ක් වෙන් කළ අතර 2023.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1.325ක් වැය වී ඇත. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 13කි.
- ජාතික ගමනාගමන කොමිෂන් සභා ගොඩනැගිල්ලෙහි වහලය මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 73.863ක් වෙන් කළ අතර 2023.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් වැය වී නොමැත.
- වවිනියාව බස් පර්යන්තයේ ප්‍රතිසංස්කරණ සඳහා රුපියල් මිලියන 10ක් වෙන් කළ අතර 2023.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 2.428ක් වැය වී ඇත. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 24කි.

2.5.2 දුරගමන් සේවා සීමිත නැවතුම් සංඥා පුවරු සවිකිරීම





අන්තර් පළාත් දුරගමන් සේවා බස්රථ සෑම බස් නැවතුමකම නවත්වමින් කෙටිදුර ගමන්ගන්නා මගීන්ද රැගෙන ධාවනය කිරීම නිසා පළාත්බද ධාවනය වන බස්රථ සේවා සමග ඇතිකරගන්නා අහිතකර තරඟය වැලැක්වීමට, දුරගමන් සේවා බස්රථ නැවැත්වීම සඳහා සීමිත නැවතුම් ස්ථාන හඳුන්වා දීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. 2019.06.18 දිනැති අංක 2128/9 දරණ ගැසට් පත්‍රය මඟින් මෙම නව සංඥාව ප්‍රසිද්ධ කර ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, ශ්‍රී ලංකා පොලිසිය, අදාළ පළාත් ප්‍රවාහන අධිකාරිය යන ආයතනයන්ගෙන් සමන්විත කමිටුව මගින් භෞතිකව පරීක්ෂා කර සීමිත නැවතුම් සංඥා පුවරුව සවිකළ යුතු සීමිත නැවතුම් ස්ථාන නිශ්චිතව හඳුනාගනු ලැබේ.

භෞතික ප්‍රගතිය

කොළඹට පිවිසෙන ප්‍රධාන පිවිසුම් මාර්ග 05 ආවරණය වන පරිදි සීමිත නැවතුම් සංඥා පුවරු සවිකිරීම සඳහා හඳුනාගන්නා ලද ස්ථාන වල සංඥා පුවරු 300ක් සවි කිරීමට, 2023 වර්ෂයේදී සැලසුම් කරන ලදී.
ඒ අනුව, 2023.12.31 වන විට සංඥා පුවරු සවි කිරීම සඳහා දිවයින පුරා ස්ථාන 1,124ක් හඳුනා ගන්නා ලද නමුත් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියට අදාල ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා 2023 නොවැම්බර් 21 වැනි දින මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ලිපිය යොමු කර ඇත.

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 10.34ක් වෙන් කළ අතර 2023.12.31 දින වන විට රුපියල් මිලියන 0.242ක් වියදම් කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 2.34 ක් වේ.



3.

තත්ත්වාරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව







මගී ප්‍රවාහනය සඳහා තනි පුද්ගලයකු හෝ තිදෙනෙකු රැගෙන යන කුඩා වාහන වෙනුවට පොදු ප්‍රවාහන සේවා යොදා ගැනීම ශ්‍රී ලංකාව වැනි රටකට වඩාත් උචිත ප්‍රවාහන ක්‍රමය වේ. නමුත් කුඩා වාහන භාවිතය අතහැර පොදු ප්‍රවාහන සේවා වෙත ආකර්ශනය කරවා ගැනීමට නම් පොදු ප්‍රවාහන සේවා මගී ජනතාව වෙත උපරිම විශ්වාසදායී, සුවපහසු මෙන්ම ආරක්ෂාකාරී පොදු බස්රථ සේවයක් විය යුතුය. ශ්‍රී ලංකාව තුළද එවන් පරිසරයක් ඇතිකරලීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තත්ත්වාරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇති අතර ඒ අනුව අන්තර් පළාත් පොදු මගී බස්රථ සේවය වඩාත් ආකර්ශනීය නව තාක්ෂණය හා බද්ධ වූ මගී ප්‍රවාහන සේවයක් බවට දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති රාශියක් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

	බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම
	ප්‍රවාහනය සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්
	පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම
	බස්රථ සඳහා GPS සවිකිරීම
	පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය (Electronic Fare Collection)
	රෙගුලාසි සකස් කිරීම හා ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

3.1 බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම

ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබාදීමේ අරමුණින් අන්තර් පළාත් පුද්ගලික බස්රථවල සේවය කරන සේවක මණ්ඩල සඳහා වෘත්තීමය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය, කාන්තා හා ළමා කටයුතු කාර්යාංශය, ජාතික අන්තරායකර ඖෂධ නියාමන අධිකාරිය, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය හා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වැනි ආයතනවල ප්‍රවීන දේශකවරුගේ සහභාගීත්වයෙන් පහත මාතෘකා ඔස්සේ දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම සිදු කරනු ලැබේ.

- මාර්ග අනතුරු අවම කරගැනීම සහ මාර්ග නීති පිළිපැදීම
- ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසරපත්‍ර වෙනුවෙන් පනවා ඇති කොන්දේසි හා නියමයන්
- පාරිභෝගික සත්කාර සේවා සැපයීමේ ක්‍රමෝපායන්
- අන්තරායකර ඖෂධ භාවිතයේ ප්‍රතිවිපාක
- බස්රථ තුළ කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම
- රිය අනතුරක් සිදු වූ අවස්ථාවකදී ක්‍රියාකල යුතු ආකාරය හා ප්‍රථමාධාර ලබාදීම

ඒ අනුව සෑම වසරකම මෙන් 2023 වර්ෂයේද පහත කාණ්ඩ යටතේ රියැදුරු කොන්දොස්තර පුහුණුව ලබා දෙන ලදී.

- නව රියදුරු කොන්දොස්තරවරුන් සඳහා වන පුහුණුව.
- සේවයේ යෙදී සිටින සේවක මණ්ඩල සඳහා අවුරුදු තුනකට වරක් ලබාදෙන පුහුණුව.
- විනය විරෝධී ක්‍රියාවල නිරතවූ රියදුරු කොන්දොස්තර මහතුන් සඳහා පවත්වන විශේෂිත පුහුණු





භෞතික ප්‍රගතිය

එක් පුහුණු සැසියකට උපරිම 120 දෙනෙකුගේ සහභාගීත්වයෙන් එවැනි වැඩමුළු 45 ක් පවත්වා පුද්ගලයින් 5,400 ක් සඳහා පුහුණුවීම් ලබාදීමට 2023 වර්ෂයේදී සැලසුම් කරන ලදී.

2023.12.31 දින විට පුහුණු වැඩසටහන් 42 ක් පවත්වා රියදුරු කොන්දොස්තරවරුන් 4,358 ක් පුහුණු කරන ලදී.

ඒ අනුව මෙම ව්‍යාපෘතියේ පුහුණු කරන ලද රියදුරු කොන්දොස්තර වරුන් අනුව භෞතික ප්‍රගතිය සියයට 81ක් වූ අතර පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව අනුව භෞතික ප්‍රගතිය සියයට 94 ක් විය.

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සංශෝධිත අයවැයෙන් 2023 වර්ෂයේ (පුනරාවර්තන වියදම්) යටතේ රුපියල් මිලියන 9.5 ක් වෙන් කළ අතර රුපියල් මිලියන 8.368ක් 2023.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 88ක් වේ.

3.2 ප්‍රවාහනය සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම අරමුණු කරගනිමින් පහත පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 06 ක් දීප ව්‍යාප්තව පළාත් කේන්ද්‍ර කොට තෝරාගත් ස්ථානයන්හි ක්‍රියාත්මක කිරීමට 2023 වර්ෂයේදී සැලසුම් කරන ලදී.

- ප්‍රවාහන පද්ධති සැලසුම්කරණය සම්බන්ධයෙන් ප්‍රවාහනයට සම්බන්ධ ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම.
- කාර්යාලීය ක්‍රම සම්බන්ධව පළාත් ප්‍රවාහන අධිකාරීවල නිලධාරීන් දැනුවත් කිරීම
- මාර්ග ආරක්ෂාව සම්බන්ධව පාසල් සිසුන් දැනුවත් කිරීමට අදාල චිත්‍ර තරඟය
- රියදුරු කොන්දොස්තරවරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේ වෛද්‍ය කඳවුර
- මගී අයිතිවාසිකම් සම්බන්ධව මගීන් සහ බස්රථ රියදුරු කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීම
- GPS තාක්ෂණය හරහා පාලන මැදිරිය මගින් නිරීක්ෂණය කර නියමිත වේග සීමාවන් උල්ලංඝණය කරමින් අධික වේගයෙන් ධාවනය කළ බස්රථවල රියදුරන් හා හිමිකරුවන් දැනුවත් කිරීම



වේග සීමාවන් උල්ලංඝණය කරමින් අධික වේගයෙන් ධාවනය කළ බස්රථවල රියදුරන් දැනුවත් කිරීම (ශ්‍රී ලංකා රථවාහන පොලිස් මූලස්ථානය සමඟ එක්ව)



රියදුරු කොන්දොස්තරවරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේ වෛද්‍ය කඳවුර



ප්‍රවාහන පද්ධති සැලසුම්කරණය සම්බන්ධයෙන් ප්‍රවාහනයට සම්බන්ධ ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම. (වරලත් ප්‍රවාහන ආයතනය - CILT



මගී අයිතිවාසිකම් සම්බන්ධව මගීන් සහ බස්රථ රියදුරු කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීම

භෞතික ප්‍රගතිය

2023.12.31 දින වන විට පැවැත්වීමට සැලසුම් කල වැඩසටහන් 06ම පවත්වන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 100 කි.

2023.12.31 වන දින මාර්ග ආරක්ෂාව සම්බන්ධව පාසල් සිසුන් දැනුවත් කිරීමට අදාල චිත්‍ර තරඟය පැවැත්වීම සඳහා සැලසුම් කලද ප්‍රමාණවත් පරිදි චිත්‍ර නොලැබීම හේතුවෙන් එම වැඩමුළුව ඉදිරි වර්ෂයේ පැවැත්වීමට තීරණය විය.

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ අයවැයෙන් රුපියල් මිලියන 4.7 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.821 ක් 2023.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 17ක් පමණි.

3.3 පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මහජනතාව වෙත සපයන සේවා වඩා කාර්යක්ෂම හා ඵලදායීව සිදු කිරීම සඳහාත් මගී ජනතාවට විශ්වසනීය, ගුණාත්මක, සුවපහසු පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් සැපයීම සඳහාත් දිනෙන් දින පොදු ප්‍රවාහන බස්රථ වලින් ඉවත්වන මගී ජනතාව නැවත පොදු ප්‍රවාහන බස්රථ සේවාව වෙත ආකර්ශනය කරගැනීම සඳහාත් කාර්යාලීය කටයුතු සඳහා සහ පොදු ප්‍රවාහන බස්රථ සඳහා නව තාක්ෂණය හඳුන්වාදීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේදී විශේෂ අවධානයක් යොමුකර ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී.

- **ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්‍රියාවලීන් ස්වයංක්‍රියකරණය කිරීමේ ව්‍යාපෘතිය**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණික ඒකකය විසින් ආයතනයේ දෘඩාංග හා මෘදුකාංග පද්ධති සංවර්ධනය කිරීම, ස්ථාපනය කිරීම මෙන්ම ආයතනයේ කාර්යය පහසු කරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික මැදිහත්වීම් සිදුකිරීම මෙම අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. මෙම තොරතුරු තාක්ෂණික ඒකකය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ගණනාවක් පවතින අතර, එම ව්‍යාපෘති වල 2023 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.








ආයතනික කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම පරිගණක මෘදුකාංගයක් හරහා සිදුකිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. මෙම ව්‍යාපෘතියේදී ආයතනයේ පවතින ධාවන, සැලසුම් හා තත්ත්ව ආරක්ෂණ යන දෙපාර්තමේන්තු වල සිදුකරනු ලබන කාර්යයන් හඳුනාගෙන එම කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම කාණ්ඩ 03ක් (Iteration wise) යටතේ සිදුකරන ලදී. ඒ තුළින් මහජනතාවට ඉක්මන් සේවාවක් ලබාදීමටත්, ආයතනයේ ලිපිගොනු කටයුතු ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයක් හරහා සිදුකිරීමෙන් වඩා විශ්වාසදායී ආරක්ෂාකාරී මෙන්ම කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

මෙම එක් එක් පද්ධති ක්‍රියාත්මක වීමේදී මෙම පද්ධති හරහා කාර්යයන් සිදුකරන නිලධාරීන් මෙම ව්‍යාපෘතියට අනුගත කරගැනීම හා භාවිතා කරන්නන්ට වඩාත් පහසුකම් සහිතව (User Friendly) එම පද්ධතින් හැසිරවීමට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදී. 2023 වර්ෂයේදී මෙම මෘදුකාංගය වඩාත් සුමටව භාවිතා කිරීමට අවශ්‍ය වූ ඒ ඒ දෙපාර්තමේන්තු විසින් ඉල්ලා ඇති සංශෝධන (Changes) සිදුකිරීමට වැඩි කාලයක් ගතකරන ලදී. එසේම මගී සේවා අවසරපත්‍රය වෙනුවට NFC කාඩ්පතක් නිකුත් කිරීමට කටයුතු ආරම්භ කර ඇති අතර එය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. 2023 වර්ෂයේදී මෙම මෘදුකාංගය ක්‍රියාත්මක වීමේදී සිදුවන ගැටළු තත්ත්වයන් අවබෝධ කරගෙන එම ක්‍රියාවලීන් වඩා සුමට කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව ආයතන ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලියේ පළමු අදියර (Phase 01) නිමකර ඇති අතර ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගන්නා ලද කුඩා වෙනස්කම් (Minor Changes) තවදුරටත් සිදුකරමින් පවතී .එහි දෙවන අදියර (Phase 02) අධාරක ක්‍රියාවලීන් - Supportive Function පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කිරීම සම්බන්ධව අධ්‍යයනය කරමින් පවතී.

- **ගූගල් තාක්ෂණය ඔස්සේ පොදු ප්‍රවාහන සේවා හඳුන්වාදීම - *General Transit Feed Specification* (GTFS)**





ගූගල් සිතියම තුළට පොදු ප්‍රවාහන සේවා ඇතුළත් කිරීම 2019 වර්ෂයේදී ආරම්භ කළ අතර, එම ව්‍යාපෘතියේ තවත් දිගුවක් වශයෙන් සියලු පළාත් ප්‍රවාහන අධිකාරීන්ගේ බස්රථ ගමන් මාර්ග මෙම ව්‍යාපෘතියට ඇතුල් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කළ අතර, ඒ අනුව බස්නාහිර පළාත් ප්‍රවාහන අධිකාරියට ඇතුළත් මාර්ග 259 ක් ද දකුණු පළාත් ප්‍රවාහන අධිකාරියේ මාර්ග 117 සහ ශ්‍රී ලංගම සහ දුම්රිය ධාවන මාර්ග තොරතුරු ද ගූගල් සිතියමට ඇතුළත් කරන ලදී.

2023 වර්ෂය අග භාගයේදී තත්‍යකාලීන තොරතුරු ලබා දීමට (GTFS-real-time) අදාල සංවර්ධන කටයුතු UNDP ආයතනය අනුග්‍රහයෙන් ආරම්භ කල අතර එය 2023.12.31 දින වන විට අවසන් අදියරෙහි පවතී.

- **මාර්ගගත ක්‍රමයෙන් බස්රථවල ආසන වෙන් කිරීමේ ව්‍යාපෘතිය**



මෙම ව්‍යාපෘතිය යටතේ අන්තර් පළාත් බස්රථ වල ගමන්ගන්නා මගීන් කල් ඇතිව ආසන වෙන් කිරීම මාර්ගගත ක්‍රමයෙන් සිදු කිරීමට අවශ්‍ය මෘදුකාංග සංවර්ධනය කිරීම 2017 වර්ෂයේදී ආරම්භ කරන ලදි.
පසුව එය 2018 වර්ෂයේ අග භාගයේදී මාර්ගගතව ආසන වෙන්කිරීමේ පහසුකම මගී ජනතාව වෙත ලබා දෙන ලදි. පසුව කොවිඩ් වසංගත කාල සීමාවෙදී මෙම සේවාව තාවකාලිකව නතර කරන ලදි. නැවත මෙම මාර්ගගතව ආසන වෙන් කිරීමේ සේවාව වැඩි දියුණු කිරීම් සහිතව නව ගෙවීම් ක්‍රම වේදයන් එකතු කර සේවා සපයනු ලබන නියොජිත ආයතනද එක් කර සංවර්ධනය කිරීමට හා නඩත්තු කටයුතු සිදුකිරීමට ආයතනයක් තෝරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු 2023 වර්ෂයේ සිට මේ දක්වා සිදුකරමින් පවතී .

පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ අයවැයෙන් යටතේ රුපියල් මිලියන 20.5ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 9.145ක් 2023.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 45ක් වේ.

3.4 බස්රථ සඳහා GPS සවිකිරීම



ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන වලංගු මගීසේවා අවසරපත්‍රලාභී බස්රථ හිමියන් නියමිත කාලසටහන් අනුව, නියමිත මාර්ගයේ නියමිත වේගයකින් ධාවනය වන්නේදැයි නවීන තාක්ෂණය ඔස්සේ පසුවිපරම් කිරීම සඳහා බස්රථ වල GPS සවි කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

ඒ අනුව 2023 වර්ෂයේ GPS සිම්පත් 25ක් නිකුත් කර ඇති අතර බස්රථ 860ක් සඳහා GPS උපකරණ සවිකර ඇත. සමුච්චිත අගයක් වශයෙන් 2023.12.31 වනවිට GPS ඒකකය හරහා බස්රථ 2,224 නියාමනය වන අතර, ඒ අනුව මුළු අන්තර් පළාත් බස්රථ වලින් 70% ක් සඳහා GPS උපකරණ සවිකර අවසන් කර ඇත.


සේවා වර්ගය	බස්රථ සංඛ්‍යාව	GPS සවිකර ඇති සංඛ්‍යාව	GPS සවිකර ඇති සංඛ්‍යාව %
අධි සුඛෝපභෝගී	184	173	94
සුඛෝපභෝගී	577	545	94.5
අර්ධ සුඛෝපභෝගී	447	394	88
සාමාන්‍ය සේවා	1,986	1,114	56.1
එකතුව	**3,194**	**2,224**	**69.6**

මූලාශ්‍රය -තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන වියදම් යටතේ) රුපියල් මිලියන 11.0 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 6.689ක් 2023.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 61 ක් වේ.

3.5 පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය (Electronic Fare Collection)





ඕනෑම බස්රථයක භාවිතා කළ හැකි ඊ-ප්‍රවේශපත්‍ර ක්‍රමයක් (e-Ticketing System) හඳුන්වා දීමට සැලසුම් කරන ලදී. ඒ අනුව කටයුතු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙනු ලබන ශ්‍රී ලංකා ගමනාගමන කාඩ්පත් යෝජනාවලිය යටතේ ප්‍රවාහනයේදී භාවිතා කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන මාර්ගස්ථ පෙරගෙවුම් කාඩ්පතක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය Backend මෘදුකාංගය සකස් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ ආයතනයක් තෝරාගෙන 2023 වර්ෂයේදී අදාල මෘදුකාගය සංවර්ධනය කටයුතු අවසන් කරන ලදී. එහි ක්‍රියාවලිය සිදුවන ආකාරය සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් වශයෙන් ගාල්ල - මාකුඹුර අධිවේගී මාර්ගයේ බස්රථවල මෙම ශ්‍රී ලංකා පෙර ගෙවීම් කාඩ්පත ක්‍රියාත්මක කරන ලද

අතර, මෙම පද්ධතියේ නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදි. තවද මෙම මෘදුකාංගය හරහා ශ්‍රී ලංකා පෙර ගෙවුම් කාඩ්පතට අමතරව දැනට භාවිතාවන අනෙකුත් තාක්ෂණික ක්‍රම (QR කේතය, VISA & Master කාඩ්පත් භාවිතය, Virtual card භාවිතය) ඔස්සේ ඊ-ප්‍රවේශපත්‍ර ලබාදීමේ හැකියාව සොයාබලා මෙම ක්‍රමවේදය බස්රථ වලට හඳුන්වාදීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ දැනුම් දීම මත එම අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි.

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් ප්‍රාග්ධන වියදම් යටතේ) රුපියල් මිලියන 11.0ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.22ක් 2023.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 2ක් වේ.

3.6 රෙගුලාසි සකස් කිරීම හා ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.



1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අදාලව කොන්දේසි හා රෙගුලාසි කෙටුම්පත් සකස් කිරීමේ කාර්යය 2023.11.23 දින සිට ආරම්භ කරන ලදී. 2023.12.31 දින වනවිට එහි තත්ත්වය පහත දක්වා ඇත.

- අදාල පනත කියවා සකස් කළ යුතු රීති වලට අදාල වගන්ති හඳුනා ගෙන ඇත.
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව මේ වනවිට ක්‍රියාත්මක කරන රීති හඳුනා ගෙන ඇත.
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක නොවන නමුත් ක්‍රියාත්මක කල යුතු රීති හඳුනා ගෙන ඇත

ඉහත කටයුතු සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව මඟින් ඉහත කාර්යයන් සිදු කරනු ලැබේ.



4.

පරිපාලන දෙපාර්තමේන්තුව


ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර පරිපාලනය, ආයතන භූමිය සහ ගොඩනැගිලි සම්බන්ධ වගකීම් ඇතුළු සියලුම මානව සම්පත් පරිපාලන කාර්යයන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පරිපාලන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ අනුව පහත සඳහන් කාර්යයන් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි.

4.1 සේවක පිරිස් පාලනය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත සේවක ව්‍යූහයට අවශ්‍ය බඳවා ගැනීම්, විශ්‍රාම ගැන්වීම්, උසස්වීම් සහ සේවක ඉල්ලා අස්වීම් සම්බන්ධ කටයුතු සහ සේවක පිරිස් පරිපාලනය සහ ඔවුන් සම්බන්ධ විනය පරිපාලනයද ඉටු කරනු ලබයි. සේවක නිවාඩු සහ සේවකයින්ගේ දැනුම කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස සේවකයින් පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ රාජකාරි කටයුතු උසස් මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දැනුම ලබාදීමට උසස් අධ්‍යාපනික සහ වෘත්තීය දැනුම වැඩි දියුණු කරගැනීමට මූල්‍ය දායකත්වය ලබා දෙනු ලැබේ .


ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ සේවක ව්‍යූහයේ වූ වෙනස්කම් පහත වගුවෙහි දැක්වේ.

උසස්වීම්	බඳවා ගැනීම්	විශ්‍රාම ගැන්වීම්	ඉල්ලා අස්වීම්	මිය යෑම්	සේවය අතහැර යාම්	සේවයෙන් පහ කිරීම
0	5	1	6	1	2	1



ආයතනයේ සේවයේ නියුතු සේවකයින්ගේ දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ කලින් කලට දියත් කරනු ලබන අතර 2023 වර්ෂය තුලදී ලබා දී ඇති අභ්‍යන්තර සහ බාහිර පුහුණු සැසි සම්බන්ධ තොරතුරු පහතින් දක්වා ඇත.

මාසය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
පුහුණු නාමය	Motivation Training		Customer care programme		Management Training	Developing the modern management			Labour Matters			Financial Regulations
පුහුණු වාර ගණන	2	0	1	0	1	1	0	0	1	0	0	2



4.2 ආයතන පාලනය

ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු වාහන සංචිතය පාලනය, සේවක සුභ සාධන කටයුතු සහ ආයතනය තුල පවතින සියළු වෘත්තීය සමිති සම්බන්ධව කටයුතු කිරීමද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවකයින් සම්බන්ධයෙන් සුභ සාධන කටයුතු ඉටු කිරීමද කරනු ලබයි.

- නිල ඇඳුම් සහ සපත්තු අවශ්‍ය සේවකයින් හට ලබා දීම.
- සේවකයින් සඳහා අග්‍රහාර රක්ෂණාවරණයක් ලබා දීම
- සුභද චාරිකා සහ සුභද හමු පැවැත්වීම
- වාර ප්‍රවේශ පත්‍ර සහ නිදහස් ගමන් අවසර පත්‍ර ලබා දීම.

මෙයට අමතරව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පහත සඳහන් පහසුකම් සැපයීම සහ අවශ්‍ය නඩත්තු කටයුතු ඉටු කරනු ලබයි.

- විදුලිය, ජලය, දුරකථන සහ අන්තර්ජාල පහසුකම්

- ගොඩනැගිලි ඉදිකිරීම් සහ නඩත්තු
- සනීපාරක්ෂක සේවා සහ පිරිසිඳු කිරීමේ සේවා
- ආරක්ෂක සේවා

වාර්ෂික ගිණුම්

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	සටහන්	2023	2022
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත සහ උපකරණ	4	381,332,175.90	365,523,476.57
නොනිමි වැඩ		-	31,582,154.10
පුස්තකාල පොත්		1,514,973.81	1,364,973.81
මුළු ජංගම නොවන වත්කම්		**382,847,149.71**	**398,470,604.48**
ජංගම වත්කම්			
ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම්	5	18,214,578.29	7,111,093.87
ලැබීම් - සේවක	6	30,685,625.00	34,170,500.00
ආයෝජන - කාලීන තැන්පත්	7	124,416,989.65	47,167,553.63
ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්	8	20,030,216.00	16,442,375.00
ලැබියයුතු පොළී ආදායම්		53,850,238.58	8,859,971.22
මුදල් හා මුදල් සමාන දෑ	9	1,016,699,026.65	645,816,144.11
මුළු ජංගම වත්කම්		**1,263,896,674.17**	**759,567,637.83**
මුළු වත්කම්		**1,646,743,823.88**	**1,158,038,242.31**
බැරකම්			
ජංගම නොවන බැරකම්			
රජයේ ප්‍රතිපාදන	10	178,634,291.85	199,801,150.37
පාරිතෝෂික වෙන්කිරීම්	11	59,363,085.50	58,167,667.00
මුළු ජංගම නොවන බැරකම්		**237,997,377.35**	**257,968,817.37**
ජංගම බැරකම්			
ගෙවිය යුතු වියදම්	12	9,340,883.40	2,092,191.14
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		144,327,804.00	51,861,404.00
වෙන්කිරීම් හා උපචිත වියදම්	13	415,286,716.86	199,240,223.88
මුළු ජංගම බැරකම්		**568,955,404.26**	**253,193,819.02**
සමුච්චිත අරමුදල		**839,791,042.27**	**646,875,605.92**
මුළු බැරකම්		**1,646,743,823.88**	**1,158,038,242.31**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කර ඇති බවට සහතික කරන ලදී.

.....

අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන)

මූල්‍ය ප්‍රකාශන වල අංක 05 සිට 08 දක්වා පිටු වල දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා අංක 09 සිට 16 දක්වා පිටු වල දක්වා ඇති සටහන් වලට අනුගතව සකස් කර ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලැබේ.

.....

සභාපති

.....

කොමිෂන් සභාවේ සාමාජික

දිනය: 2024.02.26

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ශ්‍රී ලංකා රුපියල් වලිනි)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් කාර්යඵලය පිළිබඳ ප්‍රකාශය	සටහන්	2023	2022
ආදායම්			
ආදායම්	14	691,316,567.51	387,609,647.40
වෙනත් අදායම්	15	148,232,806.28	83,357,917.98
එකතුව		**839,549,373.79**	**470,967,565.38**
වියදම්			
මෙහෙයුම් වියදම්	16		
සේවක පාරිශ්‍රමික	16.1	158,527,651.58	166,986,938.21
ප්‍රවාහන වියදම්	16.2	27,682,513.52	19,682,034.37
ගමන් වියදම් සහ යෑපිම් දීමනා	16.3	6,119,187.04	3,143,060.00
ආයතන වියදම්	16.4	59,880,228.52	41,535,932.53
ස්ථාවර වත්කම් අලුත්වැඩියා සහ නඩත්තු	16.5	3,691,607.75	3,654,588.82
සේවක සුභසාධනය	16.6	15,183,604.80	11,515,135.67
කාර්ය මණ්ඩල සංවර්ධනය	16.7	583,472.00	397,141.53
නීති හා වෙනත්ගාස්තු	16.8	2,031,539.00	2,504,645.00
සන්නිවේදන වියදම්	16.9	4,182,378.46	957,866.90
ක්ෂය වීම්	16.10	24,553,597.91	20,638,338.19
මූල්‍යගාස්තු	16.11	117,092.94	98,087.30
වෙනත් වියදම්	16.12	1,395,591.76	775,975.50
මුලු මෙහෙයුම් වියදම්		**303,948,465.28**	**271,889,744.02**
වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)		**535,600,908.51**	**199,077,821.36**
මෙහෙයුම් නොවන ආදායම්	17	**27,670.00**	**4,664,658.92**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය (ඌණතාවය)		**535,628,578.51**	**203,742,480.28**
රජයෙන්ලැබුණු ප්‍රතිපාදන			
ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන ලැබීම්	18	**1,580,000,000.00**	**725,000,000.00**
විශේෂ ව්‍යාපෘති වියදම් (රජයේ ප්‍රතිපාදන)	19.1	**1,580,000,000.00**	**725,000,000.00**
විශේෂ ව්‍යාපෘති වියදම් (ජාගකොෂ ප්‍රතිපාදන)	19.2	**42,713,142.16**	**22,481,846.98**
වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)		**492,915,436.35**	**181,260,633.30**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අතිරික්තය (ඌනතාවය)
2022 ජනවාරි **01** දිනට ශේෂය	465,614,972.62
අදාල වසර සඳහා අතිරික්තය/ ඌණතාවය	181,260,633.30
2022 දෙසැම්බර් **31** දිනටශේෂය	646,875,605.92
භාණ්ඩාගාරය වෙත යවන ලද මුදල්	300,000,000.00
අදාල වසර සඳහා අතිරික්තය/ ඌණතාවය	492,915,436.35
2023 දෙසැම්බර් **31** දිනටශේෂය	839,791,042.27

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2023	2022
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
වසර සඳහා අතිරික්තය / ඌණතාවය		492,915,436.35	181,260,633.30
මුදල් නොවන වලනයන්			
ක්ෂය වීම්		24,553,597.91	20,638,338.19
වත්කම් අපහරණය		(27,670.00)	(4,664,658.92)
ක්‍රමක්ෂය		(21,166,858.52)	(21,537,696.78)
වසර සඳහා පාරනෝෂික වියදම		5,383,828.50	5,163,951.00
පොළී අදායම		(127,065,947.76)	(61,820,221.20)
මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය - කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර		**374,592,386.48**	**119,040,345.59**
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම්			
ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම්		(11,103,484.42)	4,927,262.18
ලැබීම් - සේවක		3,484,875.00	(6,363,985.00)
ලැබිය යුතු පොළී ආදායම		(44,990,267.36)	(7,258,087.90)
ගෙවිය යුතු වියදම්		7,248,692.26	520,123.44
ආපසු ගෙවිය යුතු වෙන්ඩර් තැන්පතු		92,466,400.00	(3,747,500.00)
[illegible]		216,046,492.98	107,170,641.77
[illegible]		**637,745,094.94**	**214,588,800.08**
[illegible]		(4,188,410.00)	(2,901,822.50)
වත්කම් අපහරණයෙන් ලද මුදල්		27,670.00	4,699,752.00
මෙහෙයුම්ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්		**633,584,354.94**	**216,386,729.58**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම		(40,362,297.24)	(911,971.20)
කෙරිගෙන යන වැඩ		31,582,154.10	**(1,080,000.00)**
[illegible]		(80,837,277.02)	(3,122,240.23)
පොළී ලැබීම්		127,065,947.76	61,820,221.20
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**37,298,527.60**	**56,611,009.77**
මූල්‍ය ක්‍රියාකාරිත්වය තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		(300,000,000.00)	(10,000,000.00)
වර්ෂය තුළ මූල්‍ය ක්‍රියාකාරිත්වය තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(10,000,000.00)**	-
වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වෙනස් වීම		**370,882,882.54**	**262,997,739.35**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		645,816,144.11	382,818,404.76
වර්ෂ අවසාන මුදල් සහ මුදල් සමාන දෑ	සටහන 09	**1,016,699,026.65**	**645,816,144.11**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 ඒකාබද්ධ තොරතුරු

1.1 වාර්තාකරන ආයතනය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 1991 අංක 37 දරණ ජාගකොස පනත යටතේ ස්ථාපනය කොට ඇත. කොමිෂන් සභාවේ කාර්යාලය සහ ගණුදෙනු සිදුකරනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානය කොළඹ 05 , උද්‍යාන පාරේ අංක 241 දරන ස්ථානයෙහි පිහිටුවා ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍යමය දත්ත ඇතුලත් වේ

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය

කොමිෂන් සභාවේ කාර්යය වනු ඇත්තේ ඔමිනි බස් මගින් මගී ජනතාවට ප්‍රවාහන සේවාවන් සැලසීම පිළිබදව ශ්‍රී ලංකා රජයට උපදෙස් ලබාදීම සහ ඔමිනි බස් සඳහා නිශ්චය කර ගනු ලබන ප්‍රදේශ සඳහා මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම වේ.

1.3 2023 වර්ෂය අවසානය වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලය 173 කි. එමෙන්ම කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 1 අයෙකු සේවය කර ඇත..

1.4 වාර්තාකරන දිනය

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ දිනය දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වේ.

1.5 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය / සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත්තේ 2024.02.26 දිනය.

2 වැදගත් ගිණුම්කරන පිළිවෙත්හි සාරාංශය

2.1 පිළියෙල කිරීමේ පදනම

කොමිෂන් සභාවේ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ රාජ්‍ය අංශයේ ගිණුම් පිළිබඳ ප්‍රමිතීන් (SLPSASs) සහ පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලවය. මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ගත්මිල මත පදනම්ව වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රජයේ ගිණුම් පිළිවෙත් අනුව ඇස්තමේන්තු මත සකස් කර ඇත.
ඉහත සඳහන් ක්‍රියාවලි අනුව ආයතනයේ තොරතුරු, සටහන්, ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමේදී ගිණුම්කරණ ක්‍රියාවලියෙන් පරිබාහිර, විශේෂිත හා සංකීර්ණ වූ අවස්ථාවන් ගිණුම්කරණයට ලක් කිරීමේදී එම අවස්ථාවට යොදාගනු ලබන උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳව සටහන් අංක 3 මගින් දක්වා ඇත.

2.2 ගිණුම් පිළිවෙත් වල වෙනස්කිරීම්

පහත සඳහන් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාල සීමාව සඳහා ක්‍රමානුකූලව සඳහන් කර ඇත.

පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සසඳමින් වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම අදාල තැන්හි සංශෝධනය කර ඇත.

2.3 විදේශ විනිමය පරිවර්තනය

2.3.1 මෙහෙයුම් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇති ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ ආයතනය මෙහෙය වනු ලබන ප්‍රාථමික ආර්ථික පරිසරය අනුවය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.3.2 ගණුදෙනු සහ ශේෂය

විදේශ විනිමය ගණුදෙනු ක්‍රියාකාරකම් විනිමය ගණුදෙනු බවට පරිවර්තනය කරනුයේ ගණුදෙනු කරන දිනයේ පවත්නා විනිමය අනුපාතය මතය.

2.4 දේපළ පිරියත උපකරන පිරිවැය

දේපළ පිරියත උපකරන පිරිවැය යනු මිලදී ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීම සඳහා දරන ලද වියදම් වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට දැරූ වියදම වේ .දේපළ පිරියත සහ යන්ත්‍ර උපකරණවල වටිනාකම දක්වන විටදී එය මිලදී ගැනීමට දැරූ මූලික වියදම්න් මෙතෙක් ක්ෂයවීම් හා හානි අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

ස්ථාවර ස්වභාවයේ වත්කම අත්පත් කර ගැනීමේ, වැඩිදියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වියදම් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ තත්ත්වයට පත් කිරීම දක්වා ගිණුම් වත්කම් තීරණය ලෙස සළකා ඇත. වත්කම් වලට අදාල නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් වියදම් අදාල ආදායම් වියදම් ගිණුමට ලියාහැර ඇත.

ඉඩම් වටිනාකම ක්ෂයකිරීමට ලක් නොවන අතර අනෙකුත් වත්කම් ක්ෂයකිරීමට ලක් කිරීමේදී සරළ රේඛීය ක්ෂය ක්‍රමය යොදාගෙන ඇත. අදාල වත්කම් වල ආයුකාලය පහත පරිදි ගෙන ඇත.

වත්කම් වර්ගය	අවුරුද්ද
මෝටර් වාහන	වර්ෂ 05 තුල
ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 10 තුළ
කාර්යාල උපකරණ	වර්ෂ 05 තුල
විවිධ උපකරණ	වර්ෂ 05 තුල
පරිගණක සහ මුද්‍රන යන්ත්‍ර	වර්ෂ 04 තුල
යන්ත්‍ර	වර්ෂ 05 තුල
ගොඩනැගිලි	වර්ෂ 20 තුල
විද්‍යුත් උපකරණ (LED)	වර්ෂ 03 තුල
ක්‍රියාවලීන් ස්වයංක්‍රියකරණ පද්ධතිය	වර්ෂ 04 තුල

වත්කම් වල පොත් අගය එහි ඇස්තමේන්තුගත උපයා ගතහැකි අගයට වඩා වැඩි අගයක් ගන්නේ නම් එම වත්කම් වල පොත් අගය විහාම් උපයාගත හැකි අගයට ලියාහරිනු ලැබේ.

2.4.1 **භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් මත කරන ආයෝජන**
භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් සහ කාලීන තැන්පතු කල්පිරුණු වටිනාකම අනුව සඳහන් කර ඇත.

2.6 **ලැබීම්**
ලැබීම් යනු සේවාවන් සඳහා ලැබීමට ඇති මුදල් වේ. සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී බලාපොරොත්තු වන ලැබීම් වර්ගීකරණය කාරනාංශ ජංගම වත්කම් ශ්‍රේණිය. ලැබීම් හඳුනාගැනීම සහ මිනිනු ලබන්නේ ගණුදෙනු කරන කරන වටිනාකම /අගය මතය.

2.7 **මුදල් හා මුදල් සමාන දෑ**
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් හඳුන්වා ඇත්තේ අතැත් මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු, බැංකුවල ඇති ක්ෂණික /ස්ථාවර තැන්පතු සහ පාරිතෝෂික අරමුදල්ය

2.8 **ගෙවීම්**
ගෙවීම් යනු භාණ්ඩ හා සේවා සපයන්නන් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා අවශ්‍යයෙන් කළයුතු ගෙවීම් වේ. ගෙවීම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් කාලචක්‍රයේ කළ යුතු ගෙවීමක් නම් එය ජංගම වගකීමක් ලෙස වර්ග කරනු ලැබේ. (වසර 1 ක් හෝ ඊට අඩු) එසේ නොමැති අවස්ථාවල ඒවා ජංගම නොවන වගකීම් ලෙස හඳුන්වනු ලැබේ.
ගෙවීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ ගණුදෙනු කරන මිලට අනුව වන අතර ඉන් පසුව ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී මෙම මිලට මිණුම් කරනු ලැබේ.

2.9 **රජයේ ප්‍රතිපාදන**
මූල්‍ය නොවන ප්‍රතිපාදන ඇතුලත්ව රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒවායෙහි සාධාරන වටිනාකම අනුව හඳුනාගනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණ වලට අදාල රජයේ ප්‍රතිපාදන ජංගම නොවන වත්කම් වල රජයේ විලම්භීත ප්‍රතිපාදන යටතට ඇතුලත් කර ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී මෙය හඳුනාගනු ලබන්නේ අදාල වත්කම් වල අපේක්ෂිත ආයු කාලයේ සරළ රේඛීය පදනම මතය.

මූල්‍ය නොවන ප්‍රතිපාදන මූල්‍ය නොවන වත්කමෙහි ධාරණ වටිනාකම අනුව ගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකම් අනුව ප්‍රතිපාදන ලබාදීම සහ වත්කම් ගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

2.10 මිලදී ගැනීමේ පිරිවැය

මුදල් කාර්යඨලය පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ මිලදී ගන්නා ලද කාලය තුලය.

2.11 සේවක ප්‍රතිලාභ

කොමිෂන් සභාවට නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායකත්වය පිළිබඳ සැලසුම් ඇත

(a) නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු කොමිෂන් සභාව මගින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම අස්ථිත්වයක් වෙත ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දළ පාරිශ්‍රමිකය මත 15% ක් හා සේවා නියුක්ති භාරකාර අරමුදලට 3% ක් ගෙවනු ලැබේ.

(b) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

සේවකයාගේ සේවා පළමු වර්ෂයේ සිට සේවය කරනු ලබන සෑම වර්ෂයකම මාස ½ ක වේතනය සේවක පාරිතෝෂික අරමුදලට බැර කිරීමට කටයුතු යොදා ඇත. එසේ වෙතත් 1983 පාරිතෝෂික අරමුදල ගෙවීමේ පනතේ අංක 12 අනුව සේවයකයෙකුට පාරිතෝෂික අරමුදලට හිමිකම් ලබාගත හැක්කේ වර්ෂ 05 අඛණ්ඩ සේවාවක් කිරීමෙනි.

(c) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ පිළිබඳ වගකීම මනිනු ලබන්නේ සේවකයින් විසින් ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වටිනම් හෝ කරන ලද මූදලමය වටිනාකම මතය

2.12 ප්‍රතිපාදන සහ අවිනිශ්චිත වගකීම්

මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ අතීතයේ සිදුකරන ලද සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් කොමිෂන් සභාවට වර්තමානයේ ඇති ඍජුතික බැදීම් හෝ ඍකොමිෂන් සභාවට අවශ්‍ය ආර්ථික සම්පත් පිටතට ගලායෑම ඉදුවිය හැකි අතර විශ්වසනීය ලෙස එම ප්‍රමාණයන් ඇස්තමේන්තු ගත කල හැකිය.

දැනට පවත්නා බැදීමද වගකීම පියවීම / නිරවුල් කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම අනුව ප්‍රතිපාදන මනිනු ලැබේ.

සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහනක් ලෙස එළිදරවු කෙරේ.

2.13 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම ආයතනයට ගලා එන අවස්ථාවේදී ආදායම් වශයෙන් හඳුනාගැනීම. කොමිෂන් සභාව ආදායම් හඳුනාගනු ලබන්නේ ආදායම ප්‍රමාණය සත්‍ය වශයෙන්ම මැනිය හැකි අවස්ථාව සහ ඉදිරියේදී කොමිෂන් සභාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි සම්භාවිතාව අනුවය.

කොමිෂන් සභාව විසින් ආදායම හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන නිර්ණායක හඳුනාගත හැක. ඒ ඒ ප්‍රධාන මාර්ග වල ආදායම මැනීම සඳහා ආදේශ කර ඇත.

(a) බලපත්‍ර ආදායම

මාර්ග බලපත්‍ර වලින් ලැබෙන අදායම හඳුනාගනු ලබන්නේ කොමිෂන් සභාව වෙත අනාගතයේ ආර්ථික ප්‍රතිලාභ සැලැස්මට ඇති හැකියාව මතය.

(b) දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ

බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ලත් මුදල් / උත්පාදන මුදල් ධාරන පිරිවැයත් සමඟ සන්සන්දනය කිරීමෙනි. මෙය මුදල් කාර්යඨල ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

2.14 වියදම්

මෙහෙයුම් කරන කාලසීමාවෙදී දරන ලද වියදම් යනු වාර්තාකරන කාලයේදී ලාභය උපයාගැනීම සඳහා දරන ලද වියදමයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

2.15 ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවන ද්‍රව්‍යමය සිදුවීම් සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය තැන්වල සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

2.16 වගකීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සියලුම වැදගත් වගකීම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් කිරීම මඟින් අනාවරණය කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ පිළිවෙත් (නිමාන) සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය මඟින් විනිශ්චයන් ගණනාවක් යොදාගනු ලබන අතර වත්කම්, වගකීම්, ආදායම සහ වියදම හඳුනාගැනීම සහ මැනීම සඳහා තක්සේරු (නිමාන) සහ උපකල්පන රාශියක් උපයෝගී කරගනු ලබයි. මැනීමට යන හඳුනාගැනීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන තක්සේරු /පළාත් සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දක්වා ඇති පරිදි වේ:

(a) **ක්ෂය වීගෙන යන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය**

වත්කම්වල ආරක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වන ඉඩම, ගොඩනැගිලි සහ වාහන හැර වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරු කරනු ලබන බව කළමණාකාරීත්වය සමාලෝචනයෙහි දක්වා ඇත. මෙම අස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයන්ට ගේහූව ඇතැම් මෘදුකාංග සහ පොරපතුරු තාක්ෂණික උපාංග වල උපයෝගීතාවය ටවහාස් කිරීමට ඉවහල් වන තාක්ෂණික ක්‍රම හාවිතා කිරීමය.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4 දේපළ පිරියත සහ උපකරණ

සින්නක්කර වත්කම් - පිරිවැය

අංක	වත්කම් පංතිය	පිරිවැය				ක්ෂය ප්‍රතිශතය	ක්ෂය කිරීම්				ශේෂය 2023	ශේෂය 2022
		2023.01.01 දිනට ශේෂය	අපහරනය කිරීම්	වසර තුළදී එකතු කිරීම්	2023.12.31 දිනට ශේෂය		2023.01.01 දිනට ශේෂය	අපහරණය කිරීම්	වසර තුළදී එකතු කිරීම්	2023.12.31 දිනට ශේෂය		
1	ඉඩම	245,000,000.00	-	-	245,000,000.00	-	-	-	-	-	245,000,000.00	245,000,000.00
2	ගොඩනැගිලි	195,683,739.57	-	-	195,683,739.57	5%	97,437,392.65	-	8,969,967.98	106,407,360.63	89,276,378.94	98,246,346.92
3	මෝටර් වාහන	70,864,870.00	-	825,000.00	71,689,870.00	20%	66,009,379.30	-	1,217,941.16	67,227,320.46	4,462,549.54	4,855,490.70
4	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	35,065,652.88	57,285.20	300,063.75	35,308,431.43	10%	29,228,362.11	57,285.20	1,490,605.08	30,661,681.99	4,646,749.44	5,837,290.77
5	කාර්යාල උපකරණ	24,339,458.83	399,070.00	363,361.25	24,303,750.08	20%	21,502,425.82	399,070.00	2,390,788.37	23,494,144.19	809,605.89	2,837,033.01
6	විවිධ උපකරණ	9,218,944.55	37,941.93	215,683.60	9,396,686.22	20%	7,511,911.50	37,941.93	877,732.20	8,351,701.77	1,044,984.45	1,707,033.05
7	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	66,152,423.43	-	2,234,080.00	68,386,503.43	25%	59,112,141.31	-	3,169,974.06	62,282,115.37	6,104,388.06	7,040,282.12
8	යන්ත්‍රෝපකරණ	1,775,637.00	-	-	1,775,637.00	20%	1,775,637.00	-	-	1,775,637.00	-	-
9	විදුහුත් ප්‍රදර්ශන නාමපුවරු	62,415,360.00	-	-	62,415,360.00	33.33%	62,415,360.00	-	-	62,415,360.00	-	-
10	ක්‍රියාවලි ස්වයංක්‍රියකරණ පද්ධතිය	-	-	36,424,108.64	36,424,108.64	25.00%	-	-	6,436,589.06	6,436,589.06	29,987,519.58	-
Total		**710,516,086.26**	**494,297.13**	**40,362,297.24**	**750,384,086.37**		**344,992,609.69**	**494,297.13**	**24,553,597.91**	**369,051,910.48**	**381,332,175.90**	**365,523,476.57**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2023	2022
5 ලැබියයුතු, නැන්පතු සහ අත්තිකාරම්			
ලැබියයුතු	සටහන 5.1	16,790,482.33	4,713,820.53
නැන්පතු සහ අත්තිකාරම්	සටහන 5.2	1,424,095.96	2,397,273.34
		18,214,578.29	**7,111,093.87**
5.1 ලැබියයුතු			
ලැබිය යුතු ආදායම්		16,623,116.13	4,538,528.29
වෙනත් ලැබිය යුතු		167,366.20	175,292.24
		16,790,482.33	**4,713,820.53**
5.2 නැන්පතු සහ අත්තිකාරම්			
නැන්පතු		686,500.00	686,500.00
අත්තිකාරම් - ව්‍යාපෘති		27,000.00	55,000.00
අත්තිකාරම් - ජාගකොස		125,000.00	101,547.50
අත්තිකාරම් ගෙවීම්		585,595.96	1,554,225.84
		1,424,095.96	**2,397,273.34**
6 ලැබියයුතු - සේවක			
ආපදා ණය		27,706,675.00	28,645,050.00
රෙදිපිළි සඳහා අත්තිකාරම්		2,597,200.00	4,711,200.00
උත්සව අත්තිකාරම්		**381,750.00**	**814,250.00**
		30,685,625.00	**34,170,500.00**
7 ආශයෝජන - කාලීන තැන්පතු			
කාලීනතැන්පතු		124,416,989.65	47,167,553.63
		124,416,989.65	**47,167,553.63**

පාරිතෝෂික වගකීම් සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.47,194,738.64 (2022-46,247,553.63)

8 ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්			
භාණ්ඩාගාර බිල්පත්		20,030,216.00	16,442,375.00
		20,030,216.00	**16,442,375.00**

පාරිතෝෂික වගකීම් සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.20,030,216.00 (2022-16,442,375.00)

9 මුදල් හා මුදල් සමාන දෑ			
මුදල් -අතැති	සටහන **9.1**	554,450.00	541,744.50
මුදල් - බැංකු	සටහන **9.2**	291,753.00	2,817,699.41
කෙටිකාලීන තැන්පතු	සටහන **9.3**	1,015,852,823.65	642,456,700.20
මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල් සමාන දෑ		**1,016,699,026.65**	**645,816,144.11**
9.1 මුදල්- අතැති			
අතැති මුදල්		479,450.00	466,744.50
සුළු මුදල් අග්‍රිමය		75,000.00	75,000.00
		554,450.00	**541,744.50**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2023	2022
9.2 මුදල් - බැංකු			
මහජන බැංකුව -නාරාහේන්පිට		278,282.62	2,766,229.03
මහජන බැංකුව -නාරාහේන්පිට(ආසන වෙන් කිරීම්)		13,470.38	51,470.38
		291,753.00	**2,817,699.41**
9.3 කෙටි කාලීන තැන්පතු			
කෙටිකාලීන ආයෝජන සහ කැඳවුම් තැන්පතු		929,361,344.02	641,978,981.19
ආයෝජන- රෙපෝ		86,000,000.00	-
ඉතිරිකිරීමේ ගිණුම - ජාතික ඉතිරිකිරීමේ බැංකුව		491,479.63	477,719.01
		1,015,852,823.65	**642,456,700.20**
පාරිතෝෂික වගකීම් සඳහා වෙනම පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු මුදල රු.491,479.63 (2022-477,719.01) .			
10 රජයේ ප්‍රදාන			
ජනවාරි 01දිනට ශේෂය		199,801,150.37	**221,338,847.15**
වසර තුළ ප්‍රදාන ලැබීම්		-	-
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය		(21,166,858.52)	(21,537,696.78)
දෙසැම්බර් 31ට ශේෂය		**178,634,291.85**	**199,801,150.37**
අංක.241 උද්යාගන පාර, නාරාහේන්පිට පිහිටි ඉඩම ශ්‍රී ලංකා රජයෙන් ලද මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ප්‍රදානය ලද අවස්ථාවේ වෙළඳපොල අගයට වක්කම් සටහන් කරගන්නා ලද අතර ගොඩනැගිලිවල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය කරන ලදී			
11 ගෙවියයුතු විශ්‍රාමික ප්‍රතිලාභ			
ජනවාරි 01 දිනට ශේෂය		58,167,667.00	55,905,538.50
වසර තුළ ආයුර්ව්‍යාඛ්‍යත් වියදම්		5,383,828.50	5,163,951.00
වසර තුළ කරන ලද ගෙවීම්		(4,188,410.00)	(2,901,822.50)
දෙසැම්බර් 31 දිනට ශේෂය		**59,363,085.50**	**58,167,667.00**
12 ගෙවිය යුතු			
කුලියට ගැනීම්		47,071.79	47,071.79
වෘත්තීය සමිති සඳහා දායකත්වය		8,200.00	8,200.00
මුද්දර ගාස්තු		12,650.50	13,725.00
උපයන විට ගෙවීමේ බදු		-	58,800.00
විවිධ ණයගැතීම්යෝ		3,896,736.02	161,000.00
වෙනත් ගෙවියයුතු		1,922,376.91	581,460.19
EPF ගෙවිය යුතු		0.00	67,127.50
ETF ගෙවිය යුතු		0.00	8,055.30
ආසන වෙන් කිරීම් සඳහා ගෙවියයුතු		103,711.36	103,711.36
ආපසු ගෙවිය යුතු GPS ඒකක ගාස්තු		2,588,346.82	281,250.00
RIA ලයිට්ලව් විශ්වාසනීය		761,790.00	761,790.00
		9,340,883.40	**2,092,191.14**
13 වෙන් කිරීම් සහ උපචිත වියදම්			
උපචිත වියදම් - ව්‍යාපෘති	සටහන **13.1**	390,861,706.36	175,706,820.33
උපචිත වියදම් - පුනරාවර්තන	සටහන **13.2**	23,497,384.50	22,608,377.55
විගණන ගාස්තු වෙන් කිරීම්		927,626.00	925,026.00
		415,286,716.86	**199,240,223.88**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2023	2022
13.1 උපචිත වියදම් - ව්‍යාපෘති		
පුනරාවර්තන		
සමාජයිය සුභසාධන බස් සේවා සඳහා දායකත්වය	387,696,860.70	174,391,106.70
පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ	1,637,375.00	193,028.00
ප්‍රවාහනයේ ගුණාත්මය හා බස් ගාස්තු නියාමනය	1,527,470.66	760,551.55
ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛණ වාර්තාව	0.00	37,696.25
	390,861,706.36	**175,382,382.50**
ප්‍රාග්ධන		
පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ	-	324,437.83
	-	**324,437.83**
	390,861,706.36	**175,706,820.33**
13.2 උපචිත වියදම් - පුනරාවර්තන		
ප්‍රසාද දීමනා	15,000.00	187,500.00
පිරිසිදු කිරීමේ සේවා	866,856.74	1,078,963.72
සන්නිවේදන	401,412.36	210,247.94
විදුලිය සහ බලය	1,086,951.24	713,067.74
සේවක සුභසාධන	8,285,313.40	6,725,989.01
සේවක වෛද්‍යාධාර ක්‍රමය	-	7,500.00
ඉන්ධන සහ ලුබ්ස්	662,029.96	538,851.30
නිවාඩු දින දීමනා -විධායක	-	45,351.00
නීති ගාස්තු	5,500.00	325,700.00
ගමන් වියදම් - දේශීය	149,300.00	144,150.00
පරිගණක උපකරණ නඩත්තු	12,609.00	-
කාර්යාල උපකරණ නඩත්තු	16,388.00	244,201.35
වෘත්තීය ආයතන සාමාජික ගාස්තු	22,500.00	7,500.00
රූපවාහිනී සඳහා ආගෝරප්පාව		16,277.50
විවිධ වියදම්	27,000.00	27,000.00
පුවත්පත් සහ සඟරා	198,396.70	25,770.00
කාර්යාලයීය අවශ්‍යතා	7,271.47	293,055.30
අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන	67,691.00	1,214,288.00
පුවත්පත් දැන්වීම්	298,908.00	-
මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තුව	1,489,960.75	1,057,950.00
වැටුප් හා වේතන	22,911.25	346,529.99
ආරක්ෂක සේවා	2,833,780.87	2,545,948.15
කාර්ය මණ්ඩල පුහුණු	43,740.74	44,336.74
ප්‍රවාහන සහ කුලී ගාස්තු	159,855.00	151,800.00
ජලය	111,635.38	83,834.49
ලදුපත් මත මුද්දර ගාස්තු	17,175.00	12,800.00
ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	6,695,197.64	6,559,765.32
	23,497,384.50	**22,608,377.55**

රහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ.

2.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2023	2022
14 ආදායම		
14.1 බලපත්‍ර ආදායම්		
මාර්ග බලපත්‍ර ආදායම්	456,883.00	127,574.00
බලපත්‍ර අවන්කිරීමේ ආදායම්	109,771,324.00	26,554,715.00
මාර්ග ටෙන්ඩර් ආදායම්	443,163,433.94	194,316,814.62
	553,391,640.94	**220,999,103.62**
14.2 වෙනත් ආදායම්		
පරිපාලන ආදායම්	76,755,772.00	60,938,199.00
බැස්ටියන් මාවත වැසිකිලි ආදායම්	21,222,000.00	13,478,320.65
විවිධ ආදායම්	39,947,154.57	92,194,024.13
	137,924,926.57	**166,610,543.78**
මුළු ආදායම්	**691,316,567.51**	**387,609,647.40**
15 වෙනත් ආදායම්		
15.1 පොළී ආදායම්		
තැන්පතු මත පොළිය	125,889,823.28	60,652,351.20
ආපදාණය පොළිය	1,176,124.48	1,167,870.00
	127,065,947.76	**61,820,221.20**
15.2 වෙනත්		
රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය	21,166,858.52	21,537,696.78
	21,166,858.52	**21,537,696.78**
	148,232,806.28	**83,357,917.98**
16 මෙහෙයුම් වියදම්		
16.1 සේවක මණ්ඩල වියදම්		
වැටුප් හා වේතන	91,939,448.37	101,413,997.00
ජීවන වියදම් දීමනාව	15,826,840.00	16,936,734.06
වෘතීය දීමනා	1,139,757.00	749,612.90
භාෂා දීමනාව	315,902.00	331,740.00
සේවක අර්ථසාධක අරමුදල්	14,894,957.84	16,187,532.43
සේවක භාරකාර අරමුදල	2,978,916.23	3,237,506.49
නිවාඩු දින දීමනා -විධායක	1,126,716.00	753,390.00
අනිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන	14,059,983.00	11,402,755.00
පාවිච්චියට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	6,850,469.64	6,492,219.33
පාරිතෝෂික	5,383,828.50	5,163,951.00
ප්‍රසාද දීමනා	4,010,833.00	4,317,500.00
	158,527,651.58	**166,986,938.21**
16.2 ප්‍රවාහන		
මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු	10,546,284.94	5,940,025.59
ඉන්ධන සහ ලිහිසි	11,115,489.32	9,383,548.56
ප්‍රවාහන සහ කුලී ගාස්තු	5,020,456.31	3,081,345.38
බලපත්‍ර සහ රක්ෂණ	1,000,282.95	1,277,114.84
	27,682,513.52	**19,682,034.37**
16.3 ගමන් වියදම් හා යැපීම් දීමනා		
විදේශීය ගමන් වියදම්	157,137.32	0.00
දේශීය ගමන් වියදම්	5,962,049.72	3,143,060.00
	6,119,187.04	**3,143,060.00**

රහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වර්ෂයේමූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2023	2022
16.4 ආයතන ව්‍යදම්		
කාර්යාලයීය අවශ්‍යතා (ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ)	6,353,735.35	5,838,154.18
පිටපත් කිරීම්	12,622,234.90	9,252,568.45
විවිපතම් හා බඳු	374,220.00	374,220.00
ආරක්ෂක සේවා	17,351,145.76	12,802,424.29
විදුලිය සහ බලය	14,680,972.86	7,134,811.49
ජලය	1,312,342.04	737,219.67
අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු	1,186,600.00	1,109,000.00
රැස්වීම් සඳහා ආහාරපාන	935,799.15	312,523.15
මාර්ගස්ථ මුදල් රක්ෂණය	46,804.77	35,753.11
සන්නිවේදන	5,016,373.69	3,939,258.19
	59,880,228.52	**41,535,932.53**
16.5 ස්ථාවර වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු		
ගොඩනැගිලි අළුත්වැඩියාව	367,473.94	373,452.64
කාර්යාලයීය උපකරණ අළුත්වැඩියාව	3,292,236.81	3,240,379.86
පරිගණක සහ උපාංග අළුත්වැඩියාව	31,897.00	40,756.32
	3,691,607.75	**3,654,588.82**
16.6 සේවක සුභසාධනය		
සේවක වෛද්‍යාධාර ක්‍රමය	-	155,000.00
සේවක සුභසාධනය	13,996,052.00	11,076,960.67
නිල ඇඳුම්	1,187,552.80	283,175.00
	15,183,604.80	**11,515,135.67**
16.7 සේවක සංවර්ධනය		
සේවකා පුහුණු කිරීම්	412,400.00	205,500.00
වෘත්තිය ආයතන සාමාජික ගාස්තු	171,072.00	191,641.53
	583,472.00	**397,141.53**
16.8 නීති ගාස්තු සහ වෙනත්		
විගණන ගාස්තු	714,000.00	575,000.00
නීති ගාස්තු	1,317,539.00	1,929,645.00
	2,031,539.00	**2,504,645.00**
16.9 තොරතුරු		
පුවත්පත් දැන්වීම්	3,766,531.76	852,816.90
පුවත්පත් සහ සඟරා	415,846.70	105,050.00
	4,182,378.46	**957,866.90**
16.10 ක්ෂය		
ගොඩනැගිලි	8,969,967.98	8,969,967.98
මෝටර් වාහන	1,217,941.16	1,213,872.67
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,490,605.08	1,909,571.29
කාර්යාලයීය උපකරණ	2,390,788.37	2,819,494.00
විවිධ උපකරණ	877,732.20	919,592.02
පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර	3,169,974.06	4,805,840.23
ක්‍රියාවලි ස්වයංක්‍රියකරණ පද්ධතිය	6,436,589.06	-
	24,553,597.91	**20,638,338.19**
16.11 මූල්‍ය ගාස්තු		
බැංකු ගාස්තු	117,092.94	98,087.30
	117,092.94	**98,087.30**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2023	2022
16.12 වෙනත් වියදම්		
විවිධ වියදම්	1,329,441.76	727,575.50
ලඳුපත් සඳහා මුද්දර ගාස්තු	66,150.00	42,400.00
ව්‍යාපාරික සමාජ චගකිව	0.00	6,000.00
	1,395,591.76	**775,975.50**
17 මෙහෙයුම් නොවන ආදායම්		
අපහරණය කළ වත්කම්	27,670.00	4,664,658.92
	27,670.00	**4,664,658.92**
18 ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන		
ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන- පුනරාවර්තන	1,580,000,000.00	725,000,000.00
	1,580,000,000.00	**725,000,000.00**
19 **19.1** රජයේ ප්‍රදාන මත විශේෂ ව්‍යාපෘති වියදම්		
ව්‍යාපෘති ව්යදම් -පුනරාවර්තන		
සමාජයීය සුභසාධනය සඳහා බස් සේවා සැපයීම	1,580,000,000.00	725,000,000.00
	1,580,000,000.00	**725,000,000.00**
19.2 ජාගකොස අරමුදල් මත විශේෂ ව්‍යාපෘති වියදම්		
ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන		
පුද්ගලීකෘ බස් කාර්මාන්තයේ ප්‍රතිසංස්කරණ	19,645,239.75	5,189,845.07
ප්‍රවාහනයේ ගුණාත්මය හා බස් ගාස්තු නියාමනය	18,192,534.39	15,959,782.33
ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීම	80,787.00	85,231.75
ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම	821,460.88	629,040.00
නාගාර්කා ප්‍රවාහනා සැළසුම් කිරීම		2,100.00
	38,740,022.02	21,865,999.15
ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන		
පුද්ගලික බස් කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ බස් පර්යන්ත සංවර්ධනය		0.00
ප්‍රවාහනයේ ගුණාත්මය වැඩි දියුණු කිරීම	220,248.00	11,920.00
ආයතනික ප්‍රතිසංස්කරණ සහ යටිතලපහසුකම් සංවර්ධනය	3,752,872.14	603,927.83
	3,973,120.14	615,847.83
	42,713,142.16	**22,481,846.98**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මගී සේවා අවසරපත්‍ර දරන්නන් සඳහා මූල්‍ය අනුග්‍රහය

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 9 (ඌ) වගන්තියට අනුව කොමිෂන් සභාවට වෙත මගී සේවා අවසරපත්‍ර දරන්නන් විසින් බස් රථ සේවා සැලසීමට අදාළ ස්වකීය කටයුතු නිසි පරිදි ඉටු කල හැකිවනු පිනිස ඒ අවසර පත්‍ර දරන්නන්ට ඉංජිනේරු, තාක්ෂණික, නීතිමය, වෛද්‍ය සහ මූල්‍ය ආධාර සහ උපදෙස් ලබාදීමට බලතල පවතී.

මෙම විධිවිධාන මත පදනම්ව, අතිගරු ජනාධිපතිතුමාගේ මගපෙන්වීම සහ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ සහ ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ උපදෙස් මත, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අඩපන වූ ප්‍රවාහන ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මහජන බැංකුව සහ ලංකා බැංකුව වෙතින් මගී සේවා අවසරපත්‍ර හිමිකරුවන් වෙත රුපියල් ලක්ෂ 3 ක ණය මුදලක් ලබා දීම සඳහා පහසුකම් සලසන්නකු ලෙසින් කටයුතු කරන ලදී.

ඉහත සඳහන් කරන ලද බැංකු සමඟ ඇති කරගන්නා ලද ලද අවබෝධතා ගිවිසුම් හී මගී සේවා අවසරපත්‍ර හිමිකරුවන් වෙත ලබා දෙන ලද ණය මුදල නැවත අයකරගැනීමේ ක්‍රමවේදය දක්වා ඇති අතර එම ක්‍රමවේදය අනුව මගී සේවා අවසරපත්‍ර හිමිකරු විසින් ණය වාරික නිසි පරිදි නොගෙවන්නේ නම්, ණය මුදල ලබා ගැනීම සඳහා ඇපකරයක් ලෙස තබා ඇති අදාළ මගී සේවා අවසරපත්‍රය අවලංගු කොට එය තෙවන පාර්ශවයක් වෙත නිකුත් කිරීමෙන් ලබන්නාවූ මුදලින් පැහැර හරින ලද ණය පියවීම සඳහා පහසුකම් සැලසීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

කරුණු එසේ වන හෙයින් මගී සේවා අවසරපත්‍ර හිමිකරු විසින් ණය වාරික ගෙවීම පැහැර හැරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වගකීමක් නොවේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දින වන විට ලංකා බැංකුව වෙත අයදුම් පත් 565 ක් හා මහජන බැංකුව වෙත අයදුම් පත් 24 ක් යොමු කර ඇති නමුත් අදාළු කාර්ය සාධනය පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරීන් විසින් තවමත් වාර්තා ලබා දී නැත.

2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ශ්‍රී ලංකා ප්‍රාග්ධන ගිණුම්කරණ ප්‍රමිති අංක 3 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හා වැරදීම් සඳහා කාර්ය ලද ගැලපීම් පහත පරිදි වේ.

01) පිළිවෙලින් රු.30,000.00 ක් හා රු.38,000.00 ක් ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් ආදායම් ලෙස හඳුනා ගැනීම හා නිවැරදි කිරීම සහ ඒ අනුව මුළු ජංගම නොවන වගකීම් හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් පහල යාම.

02) රු. 1,080,000.00 ක් කෙරිගෙන යන වැඩ ලෙස හඳුනා ගැනීම හා නිවැරදි කිරීම් සහ ඒ අනුව මුළු ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් ඉහල යාම හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් ඉහල යාම.

03) රු.1,213,872.67 ක් මෝටර් රථ වාහන ඌණ ක්ෂය කිරීම් ලෙස හඳුනා ගැනීම හා නිවැරදි කිරීම සහ ඒ අනුව මුළු ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් පහල යාම හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් පහල යාම.

04) රු.2,563,907.22 ක් ලැබිය යුතු පොළී ආදායම් අධි වෙන් කිරීම් ලෙස හඳුනා ගැනීම හා නිවැරදි කිරීම සහ ඒ අනුව මුළු ජංගම වත්කම් හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් පහල යාම.

05) රු.40,683.82 ක් වූ නැවත අයකරගත යුතු ජල ගාස්තු අධි වෙන් කිරීම් ලෙස හඳුනා ගැනීම හා නිවැරදි කිරීම සහ මුළු ජංගම වත්කම් හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් පහල යාම.

06) 2022 වර්ෂයට අදාල රු.4,116,134.01 ක් වූ බැස්ටියන් මාවත වැසිකිලි ආදායම් කපා හැරීම් හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් පහල යාම.

2022 මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ඉහත කරන ලද ගැලපීම් මත 2022 වර්ෂයේ අතිරික්තය රු.188,183,231.02 සිට රු.181,260,633.30 දක්වා පහළ යන ලදී.

මෙම ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත අරමුදල් රු.653,798,203.64 සිට රු.646,875,605.92 දක්වා පහළ යන ලදී.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිඔවි/ඩී/එන්ටීසී/එෆ්ඒ/01/2023/45 ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2024 මැයි 31 දින

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතයේ 76 - 87 ට ඡේදවලට අනුකූලව ජංගම හා ජංගම නොවන වත්කම් වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම දැක්විය යුතු වුවත් කොමිෂන් සභාවේ රු.30,685,625 ක් වූ ලැබිය යුතු ආපදා ණය ලැබිය යුතු කාලසීමාව මත ජංගම නොවන වත්කම් ලෙස දැක්වීම වෙනුවට එම ණය ශේෂය ජංගම වත්කම් යටතේ පමණක් දක්වා තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු. 172,124,805ක වටිනා වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) මගී සේවා අවසර පත්‍රවලට අදාළ මාර්ග බලපත්‍ර 272ක් සඳහා වූ අළුත් කිරීමේ ආදායම, ටෙන්ඩර් බලපත්‍ර 27ක් සඳහා වූ ආදායම හා ඒ මත වූ දඩ මුදල රු.45,889,440 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකරගෙන නොතිබුණු අතර ගිණුම්වල හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් පවත්වාගෙන නොතිබුණු අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ලෙස රු.144,327,804ක් දක්වා තිබුණ ද ඉදිරිපත් කරන ලද උපලේඛනයේ ටෙන්ඩර් තැන්පතු වටිනාකම රු.49,600,000ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ රු.94,727,804ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එයට හේතු පැහැදිලි කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශ්වයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම් කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත	
18 වන වගන්තිය	පළාත් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර

		මගීන් ප්‍රවාහනය කිරීම සඳහා බස් රථ යෙදවීමට මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ බලතල කොමිෂන් සභාව සතු වුව ද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ද අන්තර් පළාත් මාර්ග සඳහා බලපත්‍ර 5ක් නිකුත් කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.8 වගන්තිය	බැස්ටියන් මාවත බස් පර්යන්තයේ දිරාගිය කණු 80 ක් නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.1,268,000 ක මුදලකට පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණු අතර සියයට 5ක කාර්යය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

බලතල , කර්තව්‍ය සහ කාර්යයන්	නිරීක්ෂණ
1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 9 වන වගන්තියේ කොමිෂන් සභා කර්තව්‍යය යටතේ මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම හා පනතේ 24 වන වගන්තිය අනුව අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට ප්‍රතිපාදන සලසා තිබුණි.	කොමිෂන් සභාව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර මගී සේවා අවසර පත්‍ර ටෙන්ඩර් වටිනාකම, අවම තාක්ෂණික අගය මත, රු.3,000, රු.10,000 හා රු.15,000 යන විවිධ වටිනාකම් මත ලබා දී තිබුණි. තව ද 2024 මැයි මස වන විට ද කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලස්වමින් ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම

ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අමප/23/1597/608/060-1 අනුව 2019 වර්ෂයේ ආරම්භ කළ ශ්‍රී ලංකා ගමනාගමන කාඩ්පත් ව්‍යාපෘතිය වෙනුවෙන් කොමිෂන් සභාව රු.391,441ක් වියදම් දරා තිබුණු නමුත් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කර තිබුණු එම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය වන විට අසාර්ථක වීම මත නතර කර තිබුණි. බව

3. වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ මහජන පැමිණිලි ඒකකය වෙත ලැබුණු 4,625 ක පැමිණිලි ප්‍රමාණයෙන් පැමිණිලි 3,476 ක් විමර්ෂණය කර තිබුනු අතර පැමිණිලි 1,149 ක් තවදුරටත් විමර්ෂණය කරමින් පවතින අතර එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 25 ක් පමණ විය.

(ආ) වවුනියා වැසිකිළි පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලැබිය යුතු වටිනාකම රු.1,536,150ක් වූ නමුත් මෙම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අන්තර් පළාත් නව දිගු දුර සංඥා කණු 300ක් ඉදිකිරීම සඳහා රු.10,340,000ක් වෙන්කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ දී රු.212,000ක් වැයකර සංඥා කණු 84ක් පමණ ඉදිකර තිබුණි. ඒ අනුව කණු 216ක් ඉදිකිරීමට නොහැකිව තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 72ක් පමණ විය. තව ද සංඥා කණු ඉදිකිරීමේ සත්‍ය පිරිවැය හා සැසඳීමේදී ඇස්තමේන්තු ගත පිරිවැය සියයට 90 කින් වැඩිපුර ගණනය කර තිබුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ දී රථවාහන කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.470,000ක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ දී ඒ සම්බන්ධයෙන් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මේ දක්වා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ලැබිය යුතු ආපදා ණය ජංගම වත්කම් යටතේ දක්වා ඇත. එහෙත් කෙටුම්පත් විගණකාධිපති වාර්තාවේ සඳහන් පරිදි 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව ලැබිය යුතු ආපදා ණය ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර දැක්වීමට කටයුතු යොදා ඇත.

(ආ) 2023 වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය වාර්තාවල වත්කම් වල වටිනාකම දැක්වීමේදී, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාවල ඇතුලත් දේපල පිරියත හා උපකරණ පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව වත්කම්වල පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගය දක්වා ඇත.

එහෙත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතුව පවතින ශූන්‍ය ශුද්ධ අගයක් සහිත වත්කම් බැහැර කිරීමේ තත්ත්වයක පැවතුනද, නව වත්කම් මිලදී ගැනීමට පවතින සීමාවන් හේතුවෙන් එම වත්කම් තව දුරටත් භාවිතයේ පවත්වා ගැනීමට සිදුවී ඇත. කෙසේ වෙතත් අප වෙත එවා ඇති කෙටුම්පත් වාර්තාවේ දැක්වෙන ආකාරයට කොමිෂන් සභාව සතුව දැනට භාවිතයේ පවතින ශූන්‍ය ශුද්ධ අගයක් සහිත වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත සමාලෝචනය කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු යොදා ඇත.

(ඇ) විවිධ හේතු මත ධාවනය නොකරනු ලබන මගී සේවා අවසර පත්‍ර වලට අදාල පොත් හා ලේඛල් කාර්යාලයට භාරදී ඇති හා යාවත්කාලීන කිරීමේ කටයුතු මේ දක්වා සිදු කර නොගන්නා ලද අවසර පත්‍ර වලින් අය විය යුතු මුදල රු. 45,889,440.00කි. එම මුදල ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කර ඇත.
එසේම විමසුමේ සඳහන් ආකාරයට 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විමසුමේ සඳහන් පරිදි අදාල හෙළිදරව් කිරීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

(ඈ) ටෙන්ඩර් අංක 28, 29, 30 හා 31 ට අදාල වටිනාකම රු.79,400,000.00 ක් වූ උපලේඛනය විගණනය වෙත ඉදිරිපත් කරන ලද නමුත් විගණන විමසුමෙන් මගහැරී ඇත.

කෙසේ වුවත් 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් වටිනාකමට තුලනය වන ආකාරයට නියමිත පරිදි උපලේඛනය සකස් කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2.2.2.

(අ) අන්තර් පළාත් මාර්ග වල ධාවනය සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි විසින් නිකුත් කර ඇති මගී සේවා අවසර පත්‍ර ජාතික ගමනාගමන කොමිෂන් සභාව හරහා නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මේවන විටත් කොමිෂන් සභාව වෙත අදාළ තොරතුරු එවා ඇති උතුරු මැද හා නැගෙනහිර පළාත් ප්‍රවාහන අධිකාරි විසින් නිකුත් කර ඇති අන්තර් පළාත් අවසර පත්‍ර විධිමත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

(ආ) බැස්ටියන් මාවත මගී බස් පර්යන්තයේ මගී වේදිකාහි වහල හා සම්බන්ධිත යකඩ කණු 80ක ප්‍රමාණයක් දිරාගොස් අබලන්වීම එම පර්යන්තය භාවිතා කරනු ලබන මගී ජනතාවට අනතුරු සිදුවීමේ අවධානමක් නිරීක්ෂණය වූ බැවින් මෙම කාර්යයට අදාලව ලංසු කැඳවන ලදී.
එමෙන්ම ලංසු ලේඛණයට අනුකූලව කොන්ත්‍රාත් කාලය දින 45ක් සහ 5%ක කාර්යය සාධනය සුරක්ෂණයක් තෝරාගත් ලංසුකරු විසින් ඉදිරිපත් කල යුතු බවද සඳහන් කර තිබූ අතර මෙම කාර්යය 2023.02.28 දින අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ලංසුකරු වන H & D Construction & Engineers (Pvt.) Ltd වෙත රු.1,268,000.00 ක මිලකට පිරිනමා ඇත.

අප්‍රේල් මස තුලදී බැස්ටියන් මාවත මගී බස් පර්යන්තය අවුරුදු සමය හේතුවෙන් පරිහරණය කරනු ලබන මගී ජනතාවගේ ප්‍රමාණය ඉතා ඉහල යන බැවින් ද වැසි සහිත කාලගුණ තත්ත්වයන් නිර්මාණවීමේ වැඩි ඉඩකඩද පවතින බැවින් මෙම ලබාදුන් කොන්ත්‍රාත්තුව ඉතා කඩිනමින් නිම කරන ලෙසට මෙම තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් වාචික උපදෙස් ලබාදෙන ලදී.

අදාල කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුව තම උපරිම ධාරිතාවෙන් සිදු කර දින 14 ක් තුලදී නිම කිරීමට ක්‍රියා කරන බවට එකඟතාව එල කර එදිනම අදාල කාර්යයන් ආරම්භ කරන ලද අතර එහිදී මෙම කාර්යයට අදාල කාර්යය සාධන සුරක්ෂණය ලබා දී නොමැත. එසේ වුවද කාර්යය සාධන සුරක්ෂණය ලබාගැනීමේ ප්‍රධාන පරමාර්ථය වන අදාල කාර්යය කොන්ත්‍රාත්කරු විසින් නිම කිරීම නියමිත පරිදි සිදුව ඇත.

එමෙන්ම මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම මිලියන 02කට අඩු බවත් (රුපියල් මිලියන දෙක නොඉක්මවන කුඩා වැඩ කොන්ත්‍රාත්වලදී කාර්යය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වයට හැකි බවද) පිරිනැමීමේ ලිපිය ලබා දුන් වහාම අදාල කාර්යයන් ආරම්භ කර දින 14ක් තුලදී නිමා කරන බවට කොන්ත්‍රාත්කරු විසින් ලිඛිතව ලබා දී ඇති බවත් හා සියලුම කාර්යයන් නිසි ලෙස නිමා කිරීමෙන් අනතුරුව පමණක් 10%රැඳවුම් මුදලක් තබා ගෙන ගෙවීම් සිදු කරන ලද බවත් වැඩිදුරටත් ඔබ වෙත කාරුණිකව සඳහන් කරමි.

කෙසේ වෙතත් ඉදිරියේදී මෙවැනි කරුණු සම්බන්ධයෙන් තවදුරටත් සැලකිලිමත්ව කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව වැඩිදුරටත් සඳහන් කරමි.

2.2.3. මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත නව ක්‍රමවේදය හරහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී.මගී සේවා අවසර පත්‍ර ගාස්තු අය කිරීම සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටු වාර්තාව ජූනි මස පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු සුදානම් කර ඇත.

පනත් සංශෝධනය දැනටමත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, එහි ත්‍රෙභාෂා පරිවර්තන කටයුතු සිදු කරමින් පවතින බව දැනුවත් කර ඇත.

2.2.4. ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව (සීසීඊඑම්) 2018.02.21 දින පැවති රැස්වීමේදී පොදු මගී ප්‍රවාහනය (බස් / දුම්රිය) සඳහා පහසු,කාර්යක්ෂම ගෙවීම් ක්‍රමවේදයක් හඳුන්වා දීමට ශ්‍රී ලංකා මහ බැංකුවට උපදෙස් ලබා දී තිබූ අතර ඒ අනුව ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමය(National Card Scheme) යටතේ ශ්‍රී ලංකා ගමනාගමන කාඩ්පත(Sri Lanka Transit Card)සහ ඒ සඳහා වන එකඟතාවය අමාත්‍ය මණ්ඩලයෙන් ලැබී ඇත. එය ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට එවකට පැවති ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට වෙත පැවරී තිබුනි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා ට්‍රාන්සිට් කාඩ්පතක් (SLTC) සහ ප්‍රවේශපත්‍ර හා ගාස්තු එකතු කිරීම සඳහා යටිතල පහසුකම් රාමුවක් සකස් කරන ලදි. ඒ අනුව මෙහි ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීම කොමිෂන් සභාවේ කර්තව්‍යක් වශයෙන් එහිදි දක්වා නැති අතර කොමිෂන් සභාව ද මෙහි එක් පාර්ශවකරුවෙකු පමණි.

ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අන්තර් පළාත් බස්රථ සඳහා ගමනාගමන කාඩ්පත් වේදිකාව(Sri Lanka Transit Card Platform)මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කල අතර අදාල පෙන්වා ඇති වියදම් එය මිලදී ගැනීමට අදාල පුවත්පත් දැන්වීම් සහ පසුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීමේදී දරන ලද වියදම් වේ.

නමුත් මෙම ව්‍යාපෘතිය ඉදිරියට යාමේදි ඇතිවූ ගැටළු සහගත තත්වයක් මත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය මගින් නැවත අමාත්‍යමණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි. මෙම ව්‍යාපෘතිය නව ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට කැබිනට් මණ්ඩලය මගින් නවකමිටුවක් පත් කරන ලද අතර ඒ අනුව අදාල ඉදිරි කටයුතු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය මගින් සිදු කරමින් පවතී.

3.

(අ) 2023 වර්ෂයේ ලද 4625ක්වූ මහජන පැමිණිලි වලින් මේ වන විට පැමිණිලි 4359 අවසන් කර ඇත. එම අවසන් නොවූ 266ක් වන පැමිණිලි අතර, ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පැමිණිලි කිරීමට අමතරව පොලිස් ස්ථාන වෙත පැමිණිලි කර අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා තෙක් අවසන් නොවූ පැමිණිලි හා පරීක්ෂණ සඳහා සහභාගී නොවීම හේතුවෙන් පරීක්ෂණ අවසන් නොකරන ලද පැමිණිලි අඩංගු වේ. එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 06% ක් පමණ වේ. එමෙන්ම දැනට අවසන් නොවූ පැමිණිලි සඳහා සිහිකැඳවීම් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටකටයුතු කර ඇත.

(ආ) වව්නියා බස් පර්යන්තයෙහි පිහිටි වැසිකිලි පද්ධතිය නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්කරුවෙකු තෝරාපත් කරගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ටෙන්ඩර් කැඳවීම නැවත නැවත සිදු කල ද වෙනත් කිසිදු ආයතනයක් මිල ගණන් ඉදිරිපත් නොකල අතර දිගින් දිගටම මිල ගණන් ඉදිරිපත් වූයේ ආරම්භයේ පටන්ම මෙම සේවාව පවත්වාගෙන යනු ලැබූ ලසික් ක්ලීනර්ස් ආයතනය වෙතින් පමණි. එම ගිවිසුම්ගත ආයතනය කුලී මුදල් ගෙවීම පැහැර හැරියද වව්නියා බස් නැවතුම්පල පරිහරණය කරනු ලබන මගී ජනතාව හා බස්රථ රියදුරන් / කොන්දොස්තරවරු වෙනුවෙන් අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා වැසිකිලි පද්ධතිය පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය විය.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් දිගින් දිගටම මාසික කුලිය ගෙවීම් කරන ලෙස අදාල ආයතනය වෙත දැනුම් දුන්නද එම වැසිකිලි පද්ධතිය සඳහා ටෙන්ඩරය ලබාගෙන තිබූ ලසික් ක්ලීනර්ස් ආයතනයේ හිමිකරු මියයාම නිසාවෙන් එම ආයතනය විසින් කුලී මුදල් ගෙවීම් පැහැර හරින ලදි. එහෙත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් වවුනියාව බස් නැවතුම්පල පරිහරණය කරන්නන්ට පහසුකම් සැලසීම පිළිබඳ ව අවධානය යොමුකල යුතු වූ බැවින් හා වෙනත් විකල්පයක් නොතිබුනු හෙයින් කුලී මුදල් නොගෙව්වද එම ආයතනයට වැසිකිලි පද්ධතිය නඩත්තු කර පවත්වාගෙන යාමට අවස්ථාව ලබාදෙන ලදි. මේවන විට අදාල ආයතනය සමග ඇති ගිවිසුම් කාලය අවසන්වී ඇති නමුත් එම ආයතනය විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තැන්පත් කර තිබූ රු.1,512,000.00 ක් වූ කාර්ය සාධන සුරක්ෂණ මුදල රඳවාගෙන ඇති අතර, එමඟින් එම ගෙවීම් නොකරන ලද කුලී මුදල වූ රු.1,536,150.00 පියවා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

ඒ අනුව වවුනියා බස් පර්යන්තයේ පරිහරණය කරන්නන්හට සනීපාරක්ෂක පහසුකම් සැලසීමට ක්‍රියාකල අතරම ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පාඩුවක් සිදු නොවීමට වගබලා ගෙන ඇති බව සඳහන් කරමි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී රු.242,000.00 ක් වැයවී ඇත්තේ දුරගමන් සේවා නැවතුම් ස්ථාන හදුනා ගැනීම සඳහා වූ ගමන් වියදම් සඳහා සහ අනෙකුත් පරිපාලන වියදම් සඳහාය.

තවද, දුර ගමන් සේවා බස් රථ සීමිත නැවතුම් සංඥා පුවරු 300ක් සැපයීම සඳහා රු.10,340,000.00ක් සමාලෝචිත වර්ෂය තුලදී (2023 වර්ෂය) ඇස්තමේන්තු කලද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රතිපාදන මගින් සීමිත නැවතුම් සංඥා පුවරු සවි කිරීමට නොහැකි වූ හේතු පහත පරිදි වේ.

2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ජාතික ගමනාගමන කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම (Presentation) සඳහා 2023.01.12 දින විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත් වූ අතර එම විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව උපදෙස් ලබාදෙන ආයතනයක් වන බවත් දුර ගමන් සේවා සීමිත සංඥා පුවරු සැපයීමේ ව්‍යාපෘතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු නොකොට එම කාර්යයේ වගකීම දරණ ආයතන හඳුනාගෙන එම ආයතන වෙත එම පුවරු සවිකිරීමට දැනුම් දෙන ලෙසත් උපදෙස් දෙන ලදි.

ඒ අනුව මාර්ග වල සංඥා පුවරු සපයා සවි කිරීම 2015.11.12 දින නිකුත් කර ඇති අංක 1940/21 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 50 වගන්ති වලට අනුව මාර්ග සංවර්ධන අධිකාරියේද කාර්යයක් වන බැවින් දුරගමන් සේවා බස්රථ සීමිත නැවතුම් සංඥාපුවරු සවිකරන ලෙස 2023.02.15 දිනැති ලිපියෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලද අතර මෙම කාර්යයෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස 2023.05.03 දින අංක NTC/PL/LS/SPO/2022 දරන ලිපිය මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලදී.

එම ලිපියට පිලිතුරු ලෙස අංක RDA/MM/W/TRSM/248 හා 2023.06.01 දිනැති ලිපියෙන් සීමිත නැවතුම් සංඥාපුවරු සවි කිරීම සඳහා ප්‍රතිපාදන මාර්ග සංවර්ධන අධිකාරිය සතුව නොමැති බවත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් සංඥාපුවරු සපයා සවි කිරීම සිදු කල හැකි බවත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් දන්වා ඇත.

මේ සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට 2023.06.14 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. සංඥාපුවරු සපයා සවි කිරීම සඳහා වැය වන මුදල ණය මුදලක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය ට ලබා දෙන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් ලබා දෙන ලදී.

97/2023 එම අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් 2023.06.16 දිනැති ලිපියෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇති අතර එම ලිපියට පිලිතුරු ලෙස සංඥාපුවරුවක් සඳහා රු.34,200.00ක් වැය වන බව අංක RDA/MM/W/TRSM/248 හා 2023.07.05 දිනැති ලිපියෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලදී.

මෙම තොරතුරු 2023.09.05 දින අධ්‍යක්ෂ පැවති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලද අතර මෙම සංඥා

පුවරු සකසා සවි කිරීම කිනම් ආයතනයක විෂය පථයට ගැනෙන්නේද යන්න සම්බන්ධයෙන් පවතින ගැටළුව නිරාකරනය කර ගැනීමට ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ මැදිහත්වීමක් ඉල්ලන ලෙස 128/2023 පරිදි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව සිමිත නැවතුම් ස්ථානවල සංඥා පුවරු සකසා සවි කිරීම කිනම් ආයතනයකින් සිදු කල යුතුද යන්න තහවුරු කරගැනීමට අමාත්‍යාංශයේ ලේකම් තුමාගෙන් උපදෙස් ඉල්ලා ඇත.

ඒ අනුව දුර ගමන් සේවා සීමිත නැවතුම් සංඥා පුවරු සැපයීම පිළිබඳව රැස්වීමක් 2023.10.27 දින ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේදී පවත්වන ලද අතර එම රැස්වීමේදී සංඥා පුවරු සකස් කිරීම හා එම සංඥා පුවරු සවිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් සිදු කල යුතුය යන්න තීරණය කරන ලදී. එම තීරණයන්ට අනුව සහ සංඥා පුවරු සැපයීමේ කාර්යය ප්‍රාග්ධන ව්‍යාපෘතියක් බැවින් එම කාර්යය ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් සිදු කිරීම ආරම්භ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත අනුමැතිය පිණිස යොමු කරන ලදී.

දුර ගමන් සේවා බස් රථ සීමිත සංඥා පුවරු සැපයීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රතිපාදන මගින් සිදු කිරීමට 2023.12.31 තෙක් මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය නොලැබින.

තවද, විගණන වාර්තාවේ **3 (ඇ)** හි සඳහන් සංඥා පුවරු 84න් 32ක් පමණක් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදල් මගින් 2022 වර්ෂයේ ඉදිකරන ලද අතර සමාලෝචිත වර්ෂය තුලදී දුර ගමන් සේවා බස් රථ සීමිත නැවතුම් සංඥා පුවරු මිලදී ගැනීමක් සිදු නොවිනි.

ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අදාල විගණන වාර්ථාවේ **3 (ඇ) ට අදාලව** සමාලෝචිත වර්ෂය තුලදී රු.242,000.00 ක් වැයවී ඇත්තේ දුරගමන් සේවා නැවතුම් ස්ථාන හඳුනා ගැනීම සඳහා වූ ගමන් වියදම් සඳහා සහ අනෙකුත් පරිපාලන වියදම් සඳහා වන අතර සමාලෝචිත වර්ෂය තුලදී (2023 වර්ෂය) දුර ගමන් සේවා බස් රථ සීමිත නැවතුම් සංඥා පුවරු මිලදී ගැනීමක් සිදු නොවූ බැවින් සත්‍ය පිරිවැය හා ඇස්තමේන්තු පිරිවැය සැසඳීමක් කල නොහැක.

(ඇ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර ඇති නාගරික ප්‍රවාහන සැළසුම් ව්‍යාපෘතිය මගින් බස් ප්‍රමුඛතා මංතීරු, Park & Ride, Car Pooling වැනි නාගරික ප්‍රවාහන තදබදය අවම කිරීම සඳහා යෝජනා සකස් කිරීමට සැළසුම් කරන ලදී. නමුත් බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රියාත්මත කිරීම හා Park & Ride ව්‍යාපෘති පසුගිය වසරවල ක්‍රියාත්මක කළද එම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක නොවුන බැවින් වෙනත් විකල්ප ක්‍රමවේදයක් හඳුනාගන්නා තුරු මෙම ව්‍යාපෘතිය යටතේ නාගරික ප්‍රවාහන කළමනාකරණ ක්‍රම හඳුනාගැනීම සම්බන්ධව සමීක්ෂණ සිදු නොකරන ලදී.

ශශී වෙල්ගම
සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

Scan the QR

ජාතික ගමනාගමන කොමිෂන් සභාව
தேசிய போக்குவரத்து ஆணைக்குழு
NATIONAL TRANSPORT COMMISSION

241, Park Road, Colombo 05. Email: info@ntc.gov.lk Web: www.ntc.gov.lk